# පෙරමග ප්‍රශංසා ප්‍රදීපය
# 2019

## “අබ්බා තාත්තේ ! අබ්බා අම්මේ !”

**(ශු. මතෙව් 6:9, යෙසායා 66:13)**



**ශුද්ධාත්ම ආගමන පුබුදු මංගල මහෝත්සවය**
**2019 පොසොන් මස 01 වන දින**
**අපරභාග 6.00 සිට 02 වන හිරුදින**
**අරුණ උදාව දක්වා ශ්‍රී ප්‍රශංසාරාමය පුණ්‍ය භූමියේ දී**

# පෙරවදන

දෙවියන් වහන්සේ, ඔවුන් වහන්සේ ප්‍රේමය ම වන නිසා තමන් වහන්සේගේ ප්‍රේමයට හිමිකම් කියන ජනතාවගේ යහපත සඳහා නිතැතින්ම ක්‍රියා කරන සේක. ඔවුන් වහන්සේගේ ඒ ප්‍රේමය කාලය තුළ, එනම්, මොහොතින් මොහොත, පැයෙන් පැය, දිනෙන් දින, සතියෙන් සතිය, මාසයෙන් මාසය සහ වසරින් වසර අප වෙත ගලාගෙන පැමිණේ. ඒ ප්‍රේමයේ අවස්ථාවන් සහ සිද්ධීන් නොනැවතී අප වෙත ආවත් ඒවාට අපගේ අවදිවීම පිළිබඳව අති මහත් වූ අඩුපාඩුවක් ඇත. මක්නිසාද යත්, ඒවා සාමාන්‍ය දේවල් ලෙස අප සලකන බැවිනි. නිදසුනක් ලෙස අපි අපගේ හුස්ම ටික ගැන සැලකිලිමත් වෙමු. හුස්මෙහි තිබෙන වටිනාකම අපට දැනෙන්නේ ඊට අවශ්‍ය වාතය අඩුවූ විට හෝ නැතිවූ විටය. බීමට ජලය ද කුසට ආහාර ද ඒ ආකාරයෙන් ම සැලකිය හැකිය.

දෙවියන් වහන්සේගේ මේ පුදුමාකාර වූ ප්‍රේමය භේදයකින් තොරව, විශේෂත්වයකින් තොරව සියලු සත්වයන් හට පොදුය. එහෙත් විශ්වයේ මැවුම්කරුවාණන්ගේ ප්‍රේමයට දැනුවත්ව අවදි වන්නට මිනිසාට කැඳවීමක් ඇත. පිබිදුනු කිතුනුවන් ලෙස තමන් හඳුනා ගන්නාවූ කිතු දන පුබුදු ජනතාව මේ අවදිවීම සලකන්නේ යාච්ඤාව ලෙසයි. එනම්, යාච්ඤාව යනු දෙව් මහෝත්තමයාණන්ගේ ප්‍රේමයට අවදි වීමයි.

කිතු දන පුබුදුව විසින් තම ජනතාව නිරතුරුවම යාච්ඤාවට යොමු කරනු ලබයි. දිනපතා 'මගේ පැය' නමින් හැඳින්වෙන්නේ අප එකිනෙකා පෞද්ගලිකව දෙවියන් වහන්සේගේ ප්‍රේමයට අවදි වන යාච්ඤාවේ මොහොතය. දිනපතා පවුලේ යාච්ඤාව; සතිපතා ප්‍රශංසා එකතුව; මසකට වරක් රාත්‍රී මෙහෙය හා සාංඝික පවුල් දිනයට සහභාගී වීම යනු අපට දේව ප්‍රේමයට අවදි වීමේ, දේව ප්‍රේමය අත්දැකීමේ අවස්ථාවන් වේ. එලෙසම සාන්ත සභාව විසින් අපට තෑගි කර තිබෙන සක්‍රමේන්තු ජීවිතය ද දිව්‍ය පූජා යාගය ද ප්‍රේමය වන දෙවියන් වහන්සේව හමුවීමේ බලගතු අවස්ථාවන්ය.

කිතු දන පුබුදු ජනතාවට දෙවියන් වහන්සේගේ ප්‍රේමය ලැබීමට උදාවන සුවිශේෂී අවස්ථාවක් වන්නේ, මුළු වර්ෂයට ම ශුද්ධාත්ම ආගමන මංගල්ලයේදී ඔවුන් වහන්සේගෙන් ලැබෙන ප්‍රේමයේ වචනයයි. ඒ වචනය අපට ලැබෙනුයේ වර්ෂය පුරා ජීවත් වීමට ලැබෙන තේමාවක් ලෙසිනි. ශුද්ධාත්ම මංගල්‍යයෙන් ඇරඹෙන්නේ කිතු දන පුබුදු නව වර්ෂයයි. එදින මුළු රාත්‍රියක් පුරාවට ඔවුන් වහන්සේගෙන් ලැබෙන වචනයට ජනතාව සවන් දෙති. තේමා දෙසුම තුළින් එය විග්‍රහ කර ගනිති. තේමා ගීය තුළින් එය ගායනා කරති. ශුද්ධාත්ම වැගිරීම අයිති කර ගැනීම තුළින් වසර පුරාවට එය ජීවත් වීමට අනුග්‍රහයක් ලබා ගනිති.

ශුද්ධ ලියවිල්ලේ සඳහන් වන පරිදි පළමු ශුද්ධාත්ම වැගිරීම සිදුවූයේ භාග්‍යවන්ත අම්මාගේ සහභාගිත්වයෙන් උඩුමහලේ රැස්වන ශ්‍රාවකයින් එකසිය විසි දෙනා මතය. මේ ශුද්ධාත්ම වැගිරීම සිදුවූයේ භාග්‍යවන්ත අම්මා ඇතුළු ශ්‍රාවකයින් එකසිය විසිදෙනාගේ දින නවයක සූදානමින් පසුවය. ඒ දින නවයේ සූදානම, ඉතිහාසයේ පළමුවන නුවාන සමය ලෙස අපට හැඳින්විය හැකිය.

2019 ශුද්ධාත්ම ආගමන මංගල්‍යයෙන් ඇරඹෙන නව වසරට අපට ඔවුන් වහන්සේගෙන් ලැබෙන්නාවූ තේමාව "අබ්බා තාත්තේ ! අබ්බා අම්මේ !" යනුයි. මේ පුදුමාකාර වූ තේමාව තුළින් ප්‍රේමය වන දෙවියන් වහන්සේ අපට හුරු පුරුදු, අපට ඉතා සමීප වූ සම්බන්ධතාවයන් තුළ ඔවුන් වහන්සේගේ පූර්ණ ප්‍රේමය අත්දකින්නට, අත්විඳින්නට ආරාධනාවක් තෑගි කරන සේක. ඔබ අතට පත්ව තිබෙන්නේ "අබ්බා තාත්තේ ! අබ්බා අම්මේ !" යන තේමාව දෙස විවිධ කෝණවලින් බලමින්, මෙනෙහි කරමින් ඒ තේමාව උත්සවාකාරයෙන් පවත්වන මංගල්‍යයට සූදානම් වීමට අත්වැලකි. අපගේ ආදරණීය ඇරයුම, මේ 'නුවානයට'; දින නවයේ සූදානමට සහභාගි වී, ශ්‍රී ප්‍රශංසාරාමයේ යාච්ඤාංගනයේ පවත්වන 2019 ශුද්ධාත්ම මංගල්‍යයට පැමිණෙන ලෙසයි.

ජේසු පිහිටයි !

# උපදෙස්

01. මෙවර පෙරමඟ ප්‍රශංසා සැකසීමේදී විශේෂ කොට දෙවියන් වහන්සේගේ මාතෘක ලක්ෂණය පිළිබඳව ඉදිරිපත් කිරීමේදී සභා ඉගැන්වීම් මෙන්ම මුල් පරිවර්ථනයන්හි යොදා ඇති හෙබ්‍රෙව් හා ග්‍රීක් වචනයන් වෙත අවධානය යොමු කොට ඇත. එය දේව ධාර්මික මෙන්ම ගැඹුරු අර්ථයන් එහි ගැබ්වී පැවතියද එම වචනවල අර්ථය ඇසුරෙන් දේව ප්‍රේමයේ මාතෘක ලක්ෂණය ඉදිරිපත් කර ඇත. එමනිසා පෙරමඟ සූදානම සඳහා සූදානම් වන වචනයේ සේවකයා මනා සූදානමකින් යුතුව වචනය බෙදා ගැනීම පිළිබඳව උනන්දු වන්න.

02. පෙරමඟ සූදානම් කාලය උපරිම පැය 1 1/2 - 2 දක්වා සීමා කරන්න.

03. විවිධ හේතූන් නිසා පෙරමඟ සූදානම් සඳහා සහභාගි විය නොහැකි අය වෙනුවෙන් ශ්‍රාවක සංඝ හා ප්‍රශංසා ගම් මට්ටමින් අවධානය යොමු කර නිසි වැඩ පිළිවෙලක් සැකසීමට පියවර ගන්න.

04. මැයි මස 24 සිකුරාදා (තුන්වන පෙරමඟ සූදානම) දිනය ශ්‍රාවක සංඝයක් ලෙස එකතු වී අර්ධ රාත්‍රියක් ලෙස ගැඹුරින් යාච්ඤාවට ඇතුල්වන දිනයක් ලෙස ගත කරන්න.

05. පෙරමඟ සූදානම් පවත්වන මෙම දින කිහිපය ඇතුළත දී සමගි සන්ධානයේ ප්‍රසාද නිධානය ලබා ගැනීමට උනන්දු කරන්න. (ශ්‍රාවක සංඝ හෝ ප්‍රශංසා ගම් ලෙස සූදානම් වන්න)

06. දිනපතා පහත පිළිවෙල අනුව පෙරමඟ සූදානම් මෙහෙයවීමට අවධානය යොමු කරන්න.

1. ආරම්භක ප්‍රශංසාව
2. ආපසු බැලීම
3. දවසේ සුපුවත

4. අප වෙතට
5. දවස පුරා
6. අවසාන ප්‍රශංසාව

07. දේව මාතෘත්වයේ මිනිස් ප්‍රකාශනය වූ භාග්‍යවන්ත අම්මා ට යාච්ඤා කරමින් දිනපතා පෙරමඟ සූදානම් අවසානයේ **'නමෝ මරිය'** යාච්ඤාව තුන් වරක් උච්චාරණය කරන්න.

# පළමුවන පෙරමඟ සූදානම
# "ඔබ වහන්සේගේ වචනය ද, කැමැත්ත ද ගින්නකි; ආශිර්වාදයකි"

(ශු. ලූක් 11:28, 12:49 ඇසුරෙන්)

පුබුදු ගී අංක 02 "නමෝ නමෝ ශුද්ධාත්මයාණනි.."

## 01. ආරම්භක ප්‍රශංසාව.

වසර පුරා ජීවත් වීමට අපට ලැබුණු තේමාව තුළ ශු. ත්‍රිත්වයම වැඩ සිටින අන්දම අපි අත්දුටිමු.
(ඔබ වහන්සේ - පියාණන් වහන්සේවද, වචනය - පුත්‍රයාණන් වහන්සේවද, ගින්න - ශුද්ධාත්මයාණන් වහන්සේවද )
අපගේ කිතුනු ජීවිත ගමන තුළ ශු.ත්‍රිත්වයක් වූ එකම දෙවියන්ට අපි නිරතුරු වන්දනා නමස්කාර කරනුයේ කිතුනු ජීවිත පැවැත්ම තුළ අපව ජීවත් කරවන දේව ආශිර්වාදය ශු. ත්‍රිත්වයක් වූ තැනැන්වහන්සේලා තුළින් අත්දකින නිසාවෙනි. පෞද්ගලිකව ද සංඝයක් ලෙස ද පුරා වසරක් අත්දුටු දේව ආශිර්වාදය වෙනුවෙන් ශු.ත්‍රිත්වයට දොහොත් මුදුන් දී නමස්කාර කරමින් ආරම්භක ප්‍රශංසාවට පිවිසෙමු.

පුබුදු ගී අංක 190 " පස් ඉඳුරන් සුවය පතා"

## 02. ක්‍රිස්තුස් වහන්සේගේ පුත්‍රභාවය දෙස බැලීම.

* පියාණන් වහන්සේගේ කැමැත්ත ඉටු කළ වචනය තෙම වන පුත්‍රයාණන් වහන්සේ පූර්ණව දේව කැමැත්තට අවනත වීම තුළින් ලද දේව ආශිර්වාදය තමන් වහන්සේට පමණක් සීමා නොවී මුළු විශ්වයටම තෑගි කරමින් මුළු විශ්වයම නවතාවයකට ඔසවන්නට විය.
  - ශු. මතෙව් 3: 13- 4:1

* තම ජීවිතය තුළින් දේව ආශිර්වාදය අන් අය වෙත නිරතුරු ගලා යෑමට ඉඩ දුන් ජේසු සමිඳාණන් එම ගමන ආරම්භ කරනු ලැබුයේ ජෝර්දාන් නදියේදී ලද ශුද්ධාත්ම ස්නාපනය සමඟිනි.

* සුවිශේෂකවරු වාර්ථා කරන අන්දමට දේව පුත්‍රයාණන් තුළ තිබුණු බැහැපත්කම ද (ශු.මතෙව් 3:13 14) දේව කැමැත්ත මුළුමනින්ම ඉටු කිරීමට තිබූ ඇතුලාන්ත ආශාව ද ( ශු.මතෙව් 3:15) පියාණන් වහන්සේගේ වචනය සොයමින් ඊට අවනත වීමට තිබූ පිපාසය ද (ශු.මතෙව් 4:1-2) මේ මහා ආශිර්වාදය අන් අය වෙතට ගලා යෑමේ රහස විය.

* මේ අයුරින් දේව කැමැත්ත ඉටු කිරීම හමුවේ ජේසු සමිඳාණෝ ආත්මයාණන් වහන්සේගේ මෙහෙයවීම තම ජීවිතය පුරා බලගතුව අත්දකින්නට විය. තම දෙමාපියන් මෙන්ම ඥාතීන් ද අත්හැර පියාණන් වහන්සේ මත පූර්ණව යැපුනු මෙන්ම ඔවුන් වහන්සේට සම්පූර්ණයෙන් යටත් වූ ජීවිත ගමනකට ඇතුලත් විය. මෙම ගමන පුරා නපුරාගේ සියුම් ක්‍රියාකාරීත්වයට අවදිවීමටත්, නපුරා පරාජය කිරීමටත්, මුළුමනින්ම ශුද්ධාත්ම මෙහෙයවීමට හසුවීමටත් ඔවුන් වහන්සේට හැකිවිය.

## 03. අපගේ පුත්‍රභාවය

පසුගිය වසරේ ශුද්ධාත්ම රැළියේ තේමා දේශනය තුළින් ස්වාමි තාත්තාගේ ජීවිතයෙන් දේව වචනයට හා දේව කැමැත්ත ඉටු කිරීමට තිබූ පිපාසය පිළිබඳව අපව අවදි කරන්නට විය.
(වචනයේ සේවකයා මෙම සිදුවීම අත්දැකීමක් ලෙස බෙදාගැනීමට යොමුවන්න)

* 1971 අප රටේ ඇති වූ තරුණ කැරැල්ල නිසා තරුණයන් බොහෝමයකට තම ජීවිතයෙන් වන්දි ගෙවීමට ද සිදු වූයේ ඉතාමත් කුරිරු අන්දමට ය. 1960 ගණන්වල සිට කොළඹ අගරදගුරු පදවියේ තරුණ කටයුතු භාර පියතුමා ලෙස පත්වීම ලැබ සිටි ස්වාමි තාත්තාට, එම විප්ලව හා එක්ව ක්‍රියා කළ ක්‍රිස්තියානි තරුණ ව්‍යාපාරයට යාව ජීව සම්බන්ධකම් පැවැත්වූ තරුණයන් කීප දෙනෙකු හේතු කොටගෙන ජීවිතයේ යම් වේදනාත්මක අත්දැකීමකට මුහුණ දීමට සිදුවී තිබුණි. මෙම අත්දැකීම සමග ජීවිතය පිළිබඳ යම් කලකිරීමකින් පසු වූ එතුමන් තම අභ්‍යන්තරයේ දැවෙන වේදනාව හා කලකිරීම තම ශ්‍රේෂ්ඨයා වන අති උතුම් දේව ධර්මාචාර්ය තෝමස් කුරේ කාදිනල් තුමාට දන්වන්නට

විය. මෙහි ප්‍රතිඵලය ලෙස කාදිනල් තුමන් විසින් එතුමන්ව ගරු වැලේරියන් ගොඩෙට් පියතුමන් යටතේ යම් නිවාඩු කාලයක් සඳහා රෝමයේ දූත සංචාරයකට යොමු කරන්නට විය. මෙම කාලසීමාව අවසන් වුවද ඇතුලාන්තයේ තිබූ වේදනාව, කලකිරීම හා නොසන්සුන්භාවය තව දුරටත් එසේම පැවතීම හේතුවෙන් වැලේරියන් පියතුමන්ගේ මිතුරෙකු වන එවකට එංගලන්තයේ සරේ ප්‍රාන්තයේ පදිංචිව සිටි බොබ් බෝල්කන් මහතාගේ පවුලට යොමු කරන්නට විය.

* එම පවුල සමඟ ජීවත් වූ කාල සීමාව තුළදී අපූරු අත්දැකීමකට මුහුණ දුනි. දිනක් ස්වාමි තාත්තා සමඟ කථාකරමින් සිටින අතර බෝල්කන් මහතාට ලැබුණ ලිපි විවර කරන්නට විය. එහි එක් ලිපියක මංගල ආරාධනාවක් විය. එය විවර කරමින් බෝල්කන් මහතා තම බිරිඳට කථා කරමින් පැවසුයේ,' මෙය දෙවියන්වහන්සේගේ කැමත්ත නම් අපි මෙම මංගල්‍යයට යමු.' ඒ පිළිබඳව ස්වාමි තාත්තාගේ ලියවිල්ලක මෙසේ සඳහන්ව ඇත. **"ඒ ප්‍රතිචාරය දුටු මම විශ්මයට පත්වීමි. මාගේ ජීවිතයේ ඒ මොහොත දක්වා ගමනක් පිටවීමට දේව කැමැත්ත විමසා නැති බව මම මෙහිදී පිළිගනිමි. එහෙත් මේ ගිහි තැනැත්තා එසේ කළේය."**

අපි ජීවිතයේ හැම දෙයකටම දෙවියන් වහන්සේගේ කැමැත්ත සොයනවාද? බෝල්කන් මහතා තුළ තිබුණ දේව සිත, දේව කැමැත්ත විමසීමේ සිත ස්වාමි තාත්තා පවසන්නේ **"එය මට ලොකු ආලෝකයක් වුනා, මට අභියෝගයත් වුනා"** කියාය.

## 04. බෙදාගැනීම

* පසුගිය වසර පුරා දේව කැමැත්ත විමසීමට යොමුවීද?
  - **i** පෞද්ගලික ජීවිතය තුළ
  - **ii** පවුලක් ලෙස
  - **iii** සංඝයක් ලෙස
* ලංකාවට පැමිණි පසුව එවකට රට තුළ පැවති තරුණ කැරැල්ල සම්බන්ධයෙන් යම් කරුණු විමසීමක් සඳහා රහස් පොලීසිය විසින් ස්වාමි තාත්තාව හතරවන තට්ටුවට ගෙනයන්නට විය. එය මිනිසෙකුට මුහුණ දිය හැකි ඉතා භයංකාර අත්දැකීමකි. මෙම

ස්ථානයට යන ගමන තුළදී ශුද්ධාත්මයාණන් වහන්සේ ස්වාමි තාත්තාගේ අභ්‍යන්තරයට කතා කරමින් පුදුමාකාර දේව වචනයක් දෙන්නට විය.

ශු. ලූක් 21: 14-15
**" ඔබ වග උත්තර දිය යුත්තේ කෙසේදැයි කල්තියා සූදානම් නොවන්නට සිතට ගන්න. ඔබගේ විරුද්ධවාදීන් කිසිවකුට නොබිඳිය හැකි වූ ද, නිශ්ප්‍රභා කළ නොහැකි වූ ද වාග් චතුරතාවයක් හා ප්‍රඥාවක් මම ඔබට දෙන්නෙමි "**

මෙම වචනය ස්වාමි තාත්තා විශ්වාස කළා. පැය 5ක් පුරා සිදුකරන ලද ප්‍රශ්න කිරීම් හමුවේ එම නිලධාරීන් පවසා සිටියේ 'ඔබ තුමාගේ ව්‍යාපාරයට දිය හැකි සහයෝගයක් තිබෙනවා නම් එය දීමට අපි සුදානම්' යනුවෙනි.

එදා මෙන්ම අදත් ස්වාමි තාත්තා දෙස බැලුවොත් දෙවියන් වහන්සේගේ වචනයට තිබෙන බලය, ගින්න, ආශිර්වාදය එතුමන් අත්දකිනවා. දේව වචනයේ බලය කිතු දන පුබුදුව තුළත් ඒ තුළින් මුළු සභාවටත් ගලා යෑම අපට දැකගත හැකියි. පිවිසීමේ කථා 8, පශ්චත්තාපික මෙහෙය හා කැපවීමේ (එතෙරවීමේ) මෙහෙය සමඟ දේව වචනයේ බලයෙන් පිබිදීමේ ව්‍යාපාරය ගොඩනැගූ එතුමා පසුකාලීනව පැවසුවේ කිතු දන පුබුදුව දෙවියන් වහන්සේගේ ස්වෛරී ක්‍රියාවක් බවයි. වසර 48ක් පුරා ශුද්ධාත්මයාණන් වහන්සේම අපව මේ ගමන ගෙනියන අන්දම අපි අද ද අත්දකිමින් සිටිමු. අප මෙම කාල සීමාව තුළදී සූදානම් වනුයේ අපගේ 50වන ජුබිලිය සඳහාය.

- එම සුදානම සමඟ අපට ලැබුණු දේව වචනයට අපි කොතෙක් ඉඩ දෙනවාද? අප තුළින් එම වචනයන් ප්‍රායෝගික කිරීම පිළිබඳ බෙදාගැනීමට යොමුවන්න.

1. මනස්ස්ථාපනය
2. ශු. ජුසේ වාස් මෙහෙවර
3. 'ප්‍රශංසා වේවා මා සමිඳුන්ට' විශ්ව ලේඛණය ප්‍රායෝගික කිරීමක් ලෙස පරිසරයට ආදරය කිරීමට යොමුවීම
4. විරෝධයේ ලකුණක් වීම.

## 05. අවසාන ප්‍රශංසාව

- මනස්ස්ථාපනයට ඇතුලු වීම. පුබුදු ගී අංක 291 "හැරෙන්න සුපුරුදු ගමන නවත්වා..."
- දේව කැමැත්ත ඉටු නොකර ක්‍රියා කළ අවස්ථාවන් හා සිද්ධීන් වෙනුවෙන් ද, දෙවියන් වහන්සේගෙන් අපට ලැබුණු වචනයන් ප්‍රායෝගික කිරීමට නොහැකි වූ අවස්ථාන් ද හඳුනා ගනිමු - මනස්ස්ථාපනයෙන් යාච්ඤාවට ඇතුළු වන්න.

## 06. දවස පුරා

1. දේව කැමැත්ත මොහොතින් මොහොත සොයන්න. පුබුදු ගී අංක 314 නිතර නිතර මුමුණන්න.
2. දේව වචනය කියවන්න. හෙට දවස පුරා දේව පොරොන්දුවක් තුළ ජීවත් වන්න.
3. පෙර සූදානම සඳහා නොපැමිණි අයෙකු සොයා ගොස් දේව වචනය ඔහුට/ ඇයට තෑගි කිරීමට පියවර ගන්න.

අවසාන ගීතිකාව - පසුගිය වසරේ තේමා ගීතිකාව

**********************

# දෙවන පෙරමඟ සූදානම
# "අබ්බා තාත්තා"

## 01. ආරම්භක ප්‍රශංසාව :

හැඳින්වීම :

විශ්වය ආරම්භයේ පටන් අද දක්වාම අඛණ්ඩව අපට ප්‍රේම කරන දේව තාත්තාට මුළු හදවතින්ම ප්‍රශංසා කරන්නට ශුද්ධාත්මයාණන් වහන්සේට ඉඩ දෙමින් මෙම ප්‍රශංසාවට ඇතුළු වෙමු. ඔවුන් වහන්සේගේ ප්‍රේමයට ඉඩ දෙමින් යාච්ඤා කරමු.

ආරම්භක ගීය : පුබුදු ගී අංක 01 "පිය පුත් සුදතුම්...."

## 02. ආපසු බැලීම :

අප අද දින සිට ප්‍රවිෂ්ඨ වනුයේ එළඹෙන වසරේ අප ඇතුළු වන්නට යන නව වසරේ තේමාවටයි. එම තේමාව මෙනෙහි කිරීමට පෙර, පසුගිය වසරේ තේමාව තුළ ජීවත් වෙමින් ලද ජීවිත අත්දැකීම් බෙදා ගන්න.

- පසුගිය දිනය පුරා දේව වචනය මෙනෙහි කරමින් දේව පොරොන්දු තුළ ජීවත් වූ ජීවිත අත්දැකීම ද,
- දේව කැමැත්ත සෙවීමට යොමු වූ අවස්ථාවන් ද බෙදා ගන්න.

## 03. සුපුවත :

* "අබ්බා" යනු ජුදෙව් ළමයින් තම පියවරුන් ආදරයෙන් ඇමතීම පිණිස යොදා ගත් අරමීය වචනයකි.
* ක්‍රිස්තුන් වහන්සේ කිසිදු සීමාවකින් තොරව "අබ්බා" කියා දෙවියන් වහන්සේ ඇමතූ සේක. ශුද්ධ ලියවිලි විශාරද ජෝන් මයර් "අබ්බා" යන්න පරිවර්ථනය කරන්නේ **"මගේම ආදර පියාණන්"** ලෙසයි.
* දෙවියන් වහන්සේ සමග ක්‍රිස්තුන් වහන්සේට පවතින ගැඹුරු මිත්‍රත්වය හා ආධ්‍යාත්මික අත්දැකීම ඉන් ප්‍රකාශ වෙයි.
* ක්‍රිස්තුන් වහන්සේ පියාණන් ලෙස දෙවියන් වහන්සේ ගැන කථා කළා පමණක් නොව ඔවුන් වහන්සේ යාච්ඤාවලදී දෙවියන් වහන්සේ "අබ්බා" ලෙස ඇමතූ සේක.

  ශු.ලූක් 10:21, ශු.මාක් 14:36, ශු.ලූක් 23:46

* එය දෙවියන් වහන්සේ හා ඔවුන් වහන්සේගේ සම්බන්ධතාවයේ විශේෂ ලක්ෂණයකි.
* "අබ්බා" යන වචනය ජුදා යාච්ඤා භාෂාවේ හෝ නිල ජුදා වන්දනාව තුළ සොයා ගත හැකි වචනයක් නොවේ.
* දෙවියන් වහන්සේ පියාණන් බව පුරාණ ගිවිසුමේද ප්‍රකාශ වෙයි. යෙසායා 63:16, යෙසායා 64:8
  එහෙත් ඔවුන්ගේ යාච්ඤාවලදී එවැනි ආමන්ත්‍රණයක් නොවීය.
  දෙවියන් වහන්සේ පියෙකු ලෙස සැලකුවද ඔවුන් වහන්සේ සමඟ එවන් සමීපතාවයක් හා ළබැඳියාවකින් සංවාදයේ යෙදීමට ඔවුන් බිය වුනේ දෙවියන් වහන්සේගේ ශුද්ධවූ භයානක, අන්‍යවූ දෙවිඳාණන් යන අවබෝධය නිසාය.
* දෙවියන් වහන්සේ පිළිබඳ ක්‍රිස්තුන් වහන්සේගේ දැක්ම වූයේ ඔවුන් වහන්සේ "අබ්බා" එනම් ආදරවන්ත පියෙක් බවයි.
  සර්වබලධාරි හා ආදරවන්ත පියෙකු මත යැපෙන විශ්වාසවන්ත පුතෙකුගේ ආකල්පය ක්‍රිස්තුන් වහන්සේ "අබ්බා" යන වචනයෙන් පිළිබිඹු කළ සේක .

## 04. අප දෙසට :

* ශු.මතෙව් 6:8
  ශ්‍රාවකයන්ට යාච්ඤා කිරීමට ඉගැන්වීමේදී ක්‍රිස්තුන් වහන්සේ සඳහන් කළේ "අපගේ පියාණෙනි" යනුවෙනි.
* ක්‍රිස්තුන් වහන්සේ කථා කළේ "මගේ පියාණෙනි" කියාය.
  (ශු.ජුවාම් 20:17) පුත්‍රභාවයේ (ක්‍රිස්තුන් වහන්සේගේ හා අපගේ) ස්වභාවයේ වෙනසක් තිබෙන අතරම ඔවුන් වහන්සේගේ පියාණන් දැන් ශ්‍රාවකයන්ගේද පියාණන් බවට පත්වී ඇත.
* රෝම 8:14-17
  ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිත පූජාවෙන් අපට උරුමවූ ශුද්ධාත්ම ස්නාපනය කරණ කොට ගෙන දේව පුත්‍රභාවයේ උරුමය ඔබට /මට හිමි වී ඇත.
* ශුද්ධාත්මයාණන්ගෙන් අප පිරෙන තරමට දේව පුත්‍රභාවයේ උරුමය භුක්ති විඳිමින් දෙවියන් වහන්සේ අපගේ ප්‍රේමණීය අබ්බා තාත්තා බව අපටද අත්දැකිය හැකිවෙයි.

## 05. බෙදා ගැනීම :

1. දේව පුත්‍රභාවය පිළිබඳ ඔබගේ අත්දැකීම බෙදා ගන්න.
**"මගේ ඇට කටු සෑදෙන විට, මව් කුසෙහි මා වැඩෙන විට, රහසිගතව මා තැනෙන විට මා එහි වූ බව ඔබ දුටු සේක."** (ගීතාවලිය 139:15)

* මා මෙලොව උපදින්නට පෙර මා දුටු මහෝත්තම දෙවියන් වහන්සේ මාගේ තාත්තා ය. ඔබ ගැන/මා ගැන හොඳින් දන්න මහෝත්තම සමිඳාණෝ අපව දුටුවේ මව් කුසේ උපදින්නටත් පෙර ය. අප ජීවත් විය යුතු ආයු කාලය ඔවුන් වහන්සේගේ පොතේ සටහන් වී ඇත. (ගීතා.139:16) අපව මෙතරම්ම හඳුනන තැනැන් වහන්සේට මා පිළිබඳව ඇත්තේ විශාල සිහිනයකි. බලාපොරොත්තුවකි. ඔබේ / මගේ ජීවිතයේ දේව සිහිනය / සැලැස්ම ඉටු වීමට කොතෙක් ඉඩ දෙනවා ද?

2. මනුෂ්‍ය පියෙකු තම දරුවාට තරවටු කරනුයේ එම දරුවාට ඇති ආදරය තුළ නිවැරදිව හැඩගැස්වීමට ය. මහෝත්තම දෙවියන් වහන්සේ අපගේ තාත්තා බව විශ්වාස කරන ඔබ / මා කොතෙක් දුරට ඔවුන් වහන්සේගේ පාලනය තුළ ඇඹෙන්නට සූදානම් ද? (2සාමුවෙල් 7:14)
මගේ සැලසුම් කඩා වැටෙන තැන, මා අකමැති මාවත්හි ගමන් කිරීමට සිදුවන විට එය භාර ගැනීමට මා කොතෙක් සූදානම් ද?

3. දේව පුත්‍රභාවයේ ලක්ෂණ ඔබට කොපමණ අයිති වී තිබෙනවා ද?
- අභිමානය - සුරක්ෂිතභාවය - සාංඝිකත්වය

## 06. හෙට දවස පුරා :

* දෙවියන් වහන්සේට අබ්බා තාත්තා කියා ඇමතීමට මොහොතින් මොහොත ශුද්ධාත්මයාණන්ගෙන් පිරෙන්න.
"සුදත් බලයෙන් පිරෙම් මම්...." ගීය දවස පුරා මුමුණන්න.

* ඔබේ ජීවිතය පිළිබඳ නැවත බැලීමට යොමුවන්න. පසුකළ ජීවිත අත්දැකීම මෙනෙහි කරන විට දේව සැලැස්ම / කැමැත්ත මා

තුළ ඉටු වී තිබේද? දේව සැලැස්ම අත්දකින්නට බාධා කරන මා තුළම තිබෙන දුබලකම් හඳුනා ගන්න. මනස්ස්ථාපනයෙන් යුතුව යාච්ඤාවට ඇතුළු වන්න. (මෙය පවුලක් ලෙසද සිදු කළ හැකිය)

* "අබ්බා තාත්තේ ..... අබ්බා තාත්තේ කියා දවස පුරා යාච්ඤා කරන්න.

## 06. අවසානය:

පුබුදු ගී 140 "මිහි දෙරණේ මා ...."

*********************

# තුන්වන පෙරමඟ සූදානම (රාත්‍රී මෙහෙය සඳහා)
# "අබ්බා අම්මා"

## 01. ආරම්භක ප්‍රශංසාව :

* පුරාණ ගිවිසුම තුළ දේව ජනතාව විවිධ අන්දමින් දෙවියන් වහන්සේගේ ආදරය අත්වින්දහ. එහෙත් ඔවුන් වහන්සේ කෙරෙහි වූ දේව ගරුබිය නිසාම, කිසිම අවස්ථාවක ඔවුන් වහන්සේගේ නාමය කියා ඔවුන් වහන්සේට ආමන්ත්‍රණය නොකළහ. ඒ වෙනුවට ආබ්‍රහම්ගේ දෙවියන් වහන්සේ, ඊසාක්ගේ දෙවියන් වහන්සේ, ජාකොබ්ගේ දෙවියන් වහන්සේ ලෙස ඔවුන් වහන්සේව ආමන්ත්‍රණය කළහ.
* නව ගිවිසුම තුළ ජේසු ක්‍රිස්තුස් වහන්සේ, දෙවියන් වහන්සේව අපට හඳුන්වා දෙනු ලැබුවේ, අපගේ ආදරණීය 'අබ්බා' පියාණන් වශයෙනි. විශේෂයෙන් සමිඳාණන් වහන්සේ ජොර්දාන් නදියේ බව්තීස්ම ස්නාපනයේ දී ප්‍රිය ප්‍රසන්න පුත්‍රභාවය අත්දැකීමත් සමඟ පාළුකරයේ දී දෙවියන් වහන්සේ අබ්බා පියාණන් ලෙසත්, අබ්බා මෑණියන් ලෙසත් ගැඹුරු අන්දමින් අත්දකිමින් දෙවියන් වහන්සේගේ පූර්ණ ප්‍රේමය අත්දුටු සේක. සමිඳුන්ගේ අභිප්‍රාය වූයේ, අප සැමද මහෝත්තම දෙවි සමිඳාණන් වහන්සේ අබ්බා පියාණන් මෙන්ම අබ්බා මෑණියන් ලෙස ඔවුන් වහන්සේගේ පූර්ණ ප්‍රේමය අත්දකිනු දැකීමය.
* පුබුදු ගී අංක 146 - අභිරහසක් කරදා ... (ගීතිකාව ගායනයට පෙර පළමුවන පද පේළියේ තේරුම පිළිබඳව සාකච්ඡා ස්වරූපයෙන් අවදි කරවන්න.)

## 02. ආපසු බැලීම :

* ශුද්ධාත්මයාණන්ගෙන් පිරීමේ අත්දැකීම කුමක්ද?
* අබ්බා තාත්තේ කියා දවස පුරා යාච්ඤා කළ හැකි වුනාද?
* දේව සැලැස්මට බාධා වන ආකාරයට මාගේ සැලසුම් තුළ ක්‍රියා කළ අවස්ථාවන් හා සිද්ධීන් මෙනෙහි කිරීමට හැකිවීද? නිරන්තරයෙන් දේව සැලැස්ම ඉටුවීමට නම් දේව කැමැත්ත විමසීමේ සිත මා තුළ තිබිය යුතුය. ඔබගේ ජීවිත සිද්ධීන් තුළ තීරණ ගැනීමට පෙර දේව කැමැත්ත කුමක්ද කියා විමසීමට යොමු වන්නේ ද?

## 03. දවසේ සුපුවත :

**(අ) ලෝක ආරම්භයේ සිටම දෙවියන් වහන්සේගේ පිතෘක මාතෘක ආදරය පිළිබිඹු වූ බව :**

ලෝක ආරම්භය දෙස බලන විට දෙවියන් වහන්සේ මිනිසා මැව්වේ, ඔවුන් වහන්සේගේ සමානකමට, ස්වරූපයට, ස්ත්‍රියද පුරුෂයාද වශයෙනි (උත්පත්ති 1:26,27). දෙවියන් වහන්සේ ඒ ප්‍රේමයේ ස්වරූපය මනුෂ්‍යයාට දානය කළ සේක. දෙවියන් වහන්සේගේ ප්‍රේමයේ ස්වරූපය ස්ත්‍රිය තුළත්, පුරුෂයා තුළත් එක සමානව තිබේ. එලෙසින් ලෝක ආරම්භයේදීම ඔවුන් වහන්සේගේ පිතෘක-මාතෘක ලක්ෂණ පිළිබිඹු විය. දෙවියන් වහන්සේ පුරුෂයාට ඔවුන් වහන්සේගේ පිතෘක ප්‍රේමයේ ලක්ෂණ වන බලය හා පිළිවෙල දානය කළ සේක. දෙවියන් වහන්සේ ස්ත්‍රියට ඔවුන් වහන්සේගේ මාතෘක ප්‍රේමයේ ලක්ෂණ වන අභිරහස්මක බව හා අලංකාර බව (සුන්දරත්වය) දානය කළ සේක. විවාහ ජීවිතය තුළ ස්වාමි පුරුෂයා හා බිරිඳ, එකම ශරීරයක් වෙමින් දෙවියන් වහන්සේගේ පූර්ණ ස්වරූපය ප්‍රකාශ කිරීමට කැඳවුම ලබති.

**(ආ) දෙවියන් වහන්සේගේ මාතෘක ප්‍රේමය "Rächamim" :**

XVI වන බෙනඩික් ශුද්ධෝත්තම පියාණන් පළකර ඇති දෙවියන් වහන්සේගේ දයාව පිළිබඳ රචිත ග්‍රන්ථයක දෙවියන් වහන්සේගේ දයාව කරුණාව සඳහා හෙබ්‍රෙව් වරුන් භාවිතා කළ වචනය හා ගර්භාෂයට පාවිච්චි කළ වචනය "රකාමිම්" **"Rächamim"** යන වචනය බව සඳහන් කර ඇත. දෙවියන් වහන්සේගේ දයා කරුණාවට අම්මාගේ ගර්භාෂයට කියන වචනයම කීමට පුරාණ ගිවිසුමේ කතුවරුන් දෙවියන් වහන්සේගේ ප්‍රේමය ගැන මොන අනාවරණයකට විවෘත වී සිටින්නට ඇත්ද? දෙවියන් වහන්සේගේ ප්‍රේමය මවකගේ ගර්භයේ ප්‍රතිරූපාකාරයෙන් ප්‍රකාශ කිරීමෙන් මනුෂ්‍යයා වෙනුවෙන් දෙවියන් වහන්සේ මවක මෙන් දුක් විඳින බව, ගැඹුරු මාතෘක ආදරයකින් මනුෂ්‍යයා වෙත ප්‍රේම කරන බව ප්‍රකාශ කරනු ලබයි.

* තවද, "ගර්භය". "රකාමිම්" කියන පදයේ අර්ථය තවදුරටත් පැහැදිලි කරමින් තව කෙනෙක් සමඟ වාසය කිරීම, තව කෙනෙක් උසුලා සිටීම, තව කෙනෙක් සමඟ එකතු වී සිටීම, මේ සියල්ල වෙනුවෙන් ශක්තිය දැරීම ලෙස ශුද්ධෝත්තම පියතුමාණෝ ඉදිරිපත් කරනු ලබති "රකාමිම්" කුමක් සඳහාද? අනිත් කෙනාව තමා තුළට ගන්නටය, එලෙස කරන්නේ කුමක් සඳහා ද? ඔහු වෙනුවෙන්, ඇය වෙනුවෙන් දුක් විඳින්නටය. දුක් විඳින්නේ කුමක් සඳහාද? තමා තුළ ඒ පුද්ගලයා සිටින දීර්ඝ කාලය තුළ එම පුද්ගලයා සංවේදනයට ලක් කරමින් ප්‍රීතිය දුක් වේදනා හරහා මුහුකුරා යෑමට සැලැස්වීමටය; ලෝකයට මුහුණ දිය හැකි තැනැත්තෙකු කිරීමටය. ඒ දුක් විඳීම තුළින්, මනුෂ්‍යයා හට ජීවය, ජීවනය, ජීවිතය ලබා දීමටය. ස්ත්‍රීයකට, මවකට ගර්භය පිහිටා ඇත්තේ දරුවෙකු හට ජීවිතය ලබා දී එම දරුවා තම ගර්භය තුළ රඳවා ගෙන, දරුවා පෝෂණය කර වර්ධනය කර, දරුවා බිහි කරන්නටයි.

* පුරාණ ගිවිසුම තුළ ගර්භාෂය නමැති වචනය උපයෝගී කරගෙන, ඔවුන් වහන්සේ තුළම අපට රැකවරණය දෙමින්, ඔවුන් වහන්සේගේ කරුණාබර ආදරය, ඔවුන් වහන්සේගේ මාතෘක ප්‍රේමය කෙබඳුද යන්න මේ ආකාරයෙන් අනාවරණය කරනු ලබයි.

04. **අප දෙසට : කුඩා සංඝ ලෙස පහත කරුණු පිළිබඳව බෙදා ගන්න.**

(අ) * මනුෂ්‍ය ලෝකය දෙස බලන විට ඇත්ත වශයෙන්ම ලෝක ආරම්භයේ සිට මනුෂ්‍යයා දුක් වේදනා තුළ ඇළී ගැළී පීඩා විඳින ආකාරය අපි දකිමු. එහිදී දෙවියන් වහන්සේ අම්මා කෙනෙකුගේ ස්වරූපය රැගෙන අපව රඳවාගෙන සිටින ගර්භය ලෙස ඔවුන් වහන්සේ ක්‍රියා කරන සේක. ඒ අබ්බා අම්මා වූ දෙවියන් වහන්සේගේ ගර්භාෂය අපට උපත දෙන්නට, අපට රැකවරණය දෙන්නට, අපට ජීවනය දෙන්නට, අපට සුරක්ෂිත භාවය දෙන්නට, අප මුහුණ දෙන දුක වේදනාව මැද්දේ අපට ආදරය දෙන්නට ක්‍රියා කරන සේක.

i දේව මාතෘක ආදරයට ඔබ කොතෙක් දුරට අවදි වී තිබේද? ඔබේ ජීවිතය තුළ දේව මාතෘක ආදරය අත්දැක තිබේද?

ii මා ගැන ඉවසමින් මා ඉන්න තත්ත්වයෙන් බාර ගනිමින් අවබෝධයෙන් මා හැරෙන මොහොත දක්වා ඔවුන් වහන්සේ මාව දරා ගෙන සිටින බව ඔබ අත්දැක තිබේද? ඊට අවදි වී තිබේද?

(ආ) අදෘෂ්‍යමාන දෙවියන් වහන්සේගේ දෘෂ්‍යමාන ස්වරූපය වූ ජේසු සමිඳාණෝ නිරන්තරයෙන් දෙවියන් වහන්සේගේ පූර්ණ ප්‍රේමය (පිතෘක මාතෘක) අත්දුටු සේක. තමන් වහන්සේ අත්දුටු එම ආදරය අන් අය වෙතට ද ගලා යෑමට ඉඩ දෙනු ලැබුයේ නිරායාසයෙනි. එහිදී දුබලයා අසරණයා වෙත නිරන්තරයෙන් ඔවුන් වහන්සේගේ දෑස යොමු වී තිබුණි. සමාජ සම්මතයන් බිඳ දමමින් ඔවුන් වහන්සේ අත්දුටු ප්‍රේමය සියල්ලන් සමඟ බෙදා ගැනීමට ද යොමු වූ සේක.

i කිතුනු සංඝය තුළින් ද ප්‍රකාශ විය යුත්තේ දෙවියන් වහන්සේගේ පූර්ණ ප්‍රේමය වන මාතෘක හා පිතෘක ආදරයයි. සංඝය ක්‍රිස්තු දේහය වන බැවින් අපගේ සංඝය තුළ එකිනෙකා පසු කරන ජීවිත සිද්ධීන් සමඟ මුහුණ දීමට සිදුවන වේදනාත්මක අත්දැකීම් ඉදිරිපිට අබ්බා අම්මා වන මහෝත්තමයාණන්ගේ ආදරය, රැකවරණය, සුරක්ෂිත භාවය අපගේ සංඝය තුළින් මා අත්දැක තිබෙනවාද?

ii විවිධත්වය තුළ ඒකත්වය අත්දකිනු ලබන සංඝය විවිධ පුද්ගලයන්ගේ එකතුවකි. වත්පොහොසත්කම්, උස්මිටිකම් මෙන්ම විවිධ අඩුපාඩු හා දුබලකම් තුළින් ද පිරුණු අපගේ සංඝයෙහි සිටින සියල්ලන් සමඟ සම්බන්ධකමක් මට තිබේද? සියළුම දරුවන්ට එකසේ ආදරය කරනු ලබන මවක් මෙන් අපගේ සංඝය නමැති ක්‍රිස්තු දේහය තුළින් එය අන් අයට ප්‍රකාශ වන්නේද?

* කුඩා සංඝ තුළ සාංඝික කර ගත් දේ පොදුවේ සාංඝික කර ගනිමු.
* ගී අංක 158 "මවකට හැකිවෙද .... " ගීය ගයමින් කෙටි ප්‍රශංසාවකට පිවිසෙමු ....

(ඇ). **ස්වාමි තාත්තා දෙවියන් වහන්සේගේ පිතෘක මාතෘක ආදරය පිළිබඳව බෙදාගත් කථාවක් :**

* එක්තරා තාත්තා කෙනෙක් තමුන්ගේ පුතා ඉපදුන දිනයේ පුතාට ලස්සන ලිපියක් ලිව්වා. 'පුතේ නුඹ හම්බ වෙන්න ඒ රත්තරන් අම්මාගේ කුසයේ ඉන්න කොට මාස 9-10 ක් තිස්සෙ, නුඹ ඉපදෙන කල් කොපමණ ආසාවෙන් බලා සිටියද? නුඹ ඉපදුනාට පස්සෙ නුඹව පිළිගත්ත අන්දම.' ඔය ආකාරයෙන් ලස්සන පිළිවෙලට ලියුම පටන් අරගන, අවසන් කළා මේ උපදේශයෙන්: 'මේ ලිපිය ඔබට කියවන්නට අවසර ලැබෙන්නේ ඔබගේ 18 වන උපන් දිනයේ දීයි. පුතේ, අවුරුදු 18 දී ඔබ මේ ලිපිය කියවනවා. අවුරුදු 18 න් පස්සේ ඔබ අපෙන් වෙන් වෙන්න හුඟක් ඉඩ තියනවා' (අමෙරිකාවේ සාමාන්‍යයෙන් අවුරුදු 18 දී දරුවෙක් දෙමව්පියන්ගෙන් ඈත් වෙනවා.) ඉතින් ඒක බලාපොරොත්තුවෙන් වෙන්නට ඕනේ, මේ තාත්තා කියනවා 'දැන් ඔබ අළුත් පියවරක් ගනියි, ඔබේ ජීවිතයේ දී ප්‍රශ්න ගැටළු වලට මුහුණ දේවි, මේ අවුරුදු 18 දී ඔබේ රත්තරන් අම්මා ඔබට හුඟක් ආදරය දානය කරන්න ඇති. මගෙන් නම් උඹට වැරදි ගොඩක් වෙන්නට ඇති. නමුත් මම දන්නවා මගෙන් කොච්චර වැරදි සිද්ධ වුනත්, නුඹ මට සමාව දෙනවා කියා. නමුත් එක දෙයක් මම ඔබට මතක් කර දෙන්න කැමතියි; ජේසු ස්වාමි දරුවෝ ප්‍රකාශ කළ උපමා කථාවක් වන අකීකරු පුත්‍රයා පිළිබඳව තියෙන ඒ කථාන්දරයේ තියෙන වචන ස්වල්පයක් ඔබට මතක් කර දෙන්න කැමතියි' කියලා, ඒ වචන ස්වල්පයෙන් ඒ ලිපිය අවසන් කළා. ඔබට මතක ඇති ජේසු ඒ උපමා කථාවේ සඳහන් කරනවා, අර අකීකරු පුතාගේ අයියා තරමක අප්‍රසන්නතාවයක් දැක්වූවා මේ අකීකරුකම් කරපු මල්ලිව පිළිගත්තාට. ඒ නිසා ඒ තාත්තා ඒ අයියාට කිව්වා, 'පුතේ, නිතරම නුඹ අප සමඟ ඉන්නවා. මට අයිති සැම දෙයක්ම නුඹට අයිතියි' මේ වචන ස්වල්පයෙන් ලිපිය අවසන් කළා. නමුත් මේ ලිපිය ඔහුට කියවන්න ලැබෙන්නේ නැහැ. අවුරුදු 18 වෙන්නට මාස කිහිපයකට පෙර හදිසි අනතුරකින් මේ පුතා මරණයට පත් වුණා.

පුතාගේ තාත්තා-අම්මා 18 වන උපන් දිනයේ දී ඒ ලිපිය අරගන කියවනවා, 'පුතේ, නුඹ මැරිලා. නමුත් අපි දෙදෙනාම නුඹ සමඟ ඉන්නවා.' මේ අම්මා-තාත්තා ලොකු හීන ගොඩක් මැව්වා ඒ පුතා පිළිබඳව, ඔය ලිපිය ලියුවේ එවැනි ලොකු හීන මවාගෙනයි.

* මෙන්න මහා අනාවරණයක්! දෙවියන් වහන්සේ ඔබේ අබ්බා අම්මා-අබ්බා තාත්තා ඔබට ලියුමක් ලියා තිබෙනවා. ඔබ ඉපදිච්ච දා නොවේ; උපදින්නට පෙර අනාදියේ සිටම ඔබට ලියුමක් ලියා තිබෙනවා. (ජෙරමියා 1:4-5) ඔබ ඒ ලියුම කියවලා තිබෙනවාද? ඔබ දිනපතා කියවන්න උත්සහ කර තිබෙනවාද?
* ඔබ ගැන මා ගැන අබ්බා අම්මා වූ මහෝත්තම දෙවියන් වහන්සේගේ සිහිනයක් තිබෙනවා. අර මිනිස් අම්මා-තාත්තා වගේ. ඒ අයගේ ඒ සිහිනය සැබෑ වුනේ නෑ. නමුත් අපේ අබ්බා-අම්මා අප සැමදෙනා පිළිබඳව තිබෙන සිහිනය, සැළැස්ම සැබෑ කරනවාමයි. ඔවුන් වහන්සේට අපව කිසිදා අමතක වෙන්නේ නැහැ. අප එනතෙක් මඟ බලා සිටිනවා. (යෙසායා 49:15)
* ශුද්ධවූ අගුස්තීනු මුනිතුමා ප්‍රකාශ කරන්නේ "අප පිළිබඳ දෙවියන් වහන්සේට ඇති ආදරණීය හා ප්‍රඥාවන්ත සැලැස්මට පිටුපෑමයි පාපය" යනුවෙනි.

  මේ පිළිබඳව ඔබේ අදහස කුඩා සංඝ තුළ බෙදා ගන්න.

## 05. **හෙට දවස පුරා :**

* අබ්බා-අම්මා වූ දෙව් මහෝත්තමයාණන්ගේ මාතෘක ආදරය අත්දකිමින් ඔවුන් වහන්සේගේ ගර්භය තුළ ජීවත්වෙමි, හැසිරෙමි, පවතිමි. (ක්‍රියා 17:28) මෙයට නිතර නිතර දවස පුරා අවදි වන්න.
* ඒ පිළිබඳව මා ලබන අත්දැකීම මට හමුවන අනිත් අය සමඟ සාංඝික කර ගන්න.
* අද දින පෙරමඟ සුදානමට සහභාගි නොවූ එක් අයකු සමඟවත් අද දින මා ලැබූ අත්දැකීම සාංඝික කර ගන්න.

## 06. **අවසන් ප්‍රශංසාව :**

* ගීතාවලිය 139:1-18, 23-24 දක්වා - ගීතයේ ඇති **'සමිඳුනි'** සහ **'ඔබ'**යන වදන් වලට **'අබ්බා අම්මේ, ඔබ'** යනුවෙන් යොදා ගෙන යාච්ඤාවක් ලෙස ගයමු.

  පුබුදු ගී අංක 160 "ඔසොවා යන සේ පැටවුන්....."

*********************

# හතරවන පෙරමඟ සූදානම
# පුරාණ ගිවිසුම තුළ හඳුනා ගත හැකි
# දේව මාතෘත්වයේ හා පීතෘත්වයේ අත්දැකීම

## 01. ආරම්භක ප්‍රශංසාව : රෝම 8 :15-17

"මන්ද ඔබ ලබා ඇත්තේ නැවතත් බිය ගෙන දෙන වහල් සේවයේ තත්ත්වය නොව 'අබ්බා පියාණනි' යැයි අමතා යාච්ඤා කිරීමට ඉඩ ඇති පුත්‍රකම ලැබීමේ තත්ත්වයකි... අපි දරුවෝ නම් උරුමක්කාරයෝ වම්හ... දෙවියන් වහන්සේට අබ්බා කියන්නට පුත්‍රයාණන් වහන්සේට පමණක්ම ඇති අයිතිය ක්‍රිස්තුන් වහන්සේ තුළ පුතෙකු වූ ඔබට /මට හිමිවී ඇත. එවැනි භාග්‍යවන්තකමක්, උරුමයක් ලැබූවෙකු ලෙස ගැඹුරු ඇතුලාන්ත නිදහසකින් ප්‍රීතියකින් යුතුව 'අබ්බා තාත්තේ, අබ්බා අම්මේ' යැයි පියාණන්වහන්සේ අමතමින් අද දවසේ ප්‍රශංසාවට ඇතුළු වෙමු.
පුබුදු ගී අංක 150 "ඔබෙන් තොරවු..."

## 02. ආපසු බැලීම

ළඟ සිටින කෙනෙක් සමඟ සාංඝික වෙමු.

* මහෝත්තමවූ දෙවියන් වහන්සේ 'අබ්බා-අම්මා' බවට අවදි වන්නට, ඊයේ දවස තුළ අවස්ථා ලැබුණාද?
* "රකාමිම්" පිළිබඳව ඔබ අවබෝධ කරගත් දේ බෙදාගන්න
* කලින් දිනවල පෙර මඟ සූදානම් වලට සහභාගි නොවූ අයට කථා කරන්නට හැකි වූවාද?

## 03. දවසේ සුපුවත

ලෝකාරම්භයේ සිටම ආනාවරණය වූ දෙවියන් වහන්සේගේ පීතෘක මාතෘක ආදරය මුළු පුරාණ ගිවිසුම තුළම දිගහැරෙන අයුරු විශ්මිතය. දෙවියන් වහන්සේ තෝරාගත් පළමු මිනිසාව මෙලොව ජනිත කරන්නට ඔවුන් වහන්සේ ගත් පළමු පියවරම පිතෘක මාතෘක ප්‍රේමයේ ප්‍රකාශනයකි. ලොව පළමු මිනිසාව බිහි කළ අම්මාට අප කියන්නේ තාත්තා කියාය. දෙවියන් වහන්සේ අප මැවූ තැනැත්

වහන්සේ යයි කී කල අප වැදූ තැනැන් වහන්සේද ඔවුන් වහන්සේම වන්නාහ. එම නිසා දෙවියන් වහන්සේගේ පිතෘක මාතෘක ආදරය ලොව මැවූ මොහොතේ පටන්ම අනාවරණය වේ.

**(අ) උත්පත්ති 1:27-28**

දෙවියන් වහන්සේ තම ස්වරූපය අනුව මිනිසා මැවූ සේක. දෙවියන් වහන්සේගේම ස්වරූපය අනුව ඔවුන් මවා වදාළ සේක. ස්ත්‍රිය ද පුරුෂයා ද වශයෙන් ඔවුන් මැවූ සේක. පුරුෂයෙකු තුළින් ඉස්මතු වන දෙවියන් වහන්සේගේ පිලිවෙළ හා බලය ඔහුට දානය කරමින් ද, ස්ත්‍රියක තුළින් විද්‍යාමාන වන දෙවියන් වහන්සේගේ සුන්දරත්වය හා අභිරහස්මක බව ඇයට තෑගි කරමින් ද තම ස්වරූපයට දෙදෙනාම මැවීම තුළ දෙවියන් වහන්සේගේ පිතෘක හා මාතෘක ස්වභාවය අනාවරණය වේ. දෙවියන් වහන්සේගේ කරුණාබර ආදරය - මාතෘක ආදරය, මිනිසාව මවන්නට, දෙදෙනෙක් එක්කෙනෙකු කරන්නට මවකගේ ගර්භය තුළ කළ පුදුම ක්‍රියාවම දෙවියන් වහන්සේගේ මාතෘක පිතෘක ආදරය ප්‍රකාශ වීමක්ය.

**(ආ) නික්මයාම 3:5, 1වංශාවලිය 13:9-10**

ආදි මව්පියන්ගේ පාපය හේතු කොට ගෙන බිඳවැටුණු දෙව් මිනිස් සම්බන්ධතාවය නිසා පුරාණ ඊශ්‍රායෙල් ජනතාව තුළ දෙවියන් වහන්සේ පිළිබඳ පැවතීයේ බියකි. ඔවුන් දෙවියන් වහන්සේව අත්දුටුවේ ශුද්ධවූ, වෙනස්වූ, අසමසම, භයානක දෙව් කෙනෙකු ලෙසය. ඔවුන් වහන්සේව නමින් පවා ආමන්ත්‍රණය කරන්නට ඔවුන් දැක්වුයේ බියකි. කෙනෙකු එම නාමය ප්‍රකාශ කළහොත් එය ප්‍රකාශ කරන පුද්ගලයා මරණීය දණ්ඩනය ලැබිය යුතු වරදක් කළ කෙනෙකු ලෙස සැළකූහ. දෙවියන් වහන්සේගේ නම ප්‍රකාශ කරන ලද්දේ "YHWH" යන අකුරු හතර ලිවීමෙනි. එසේ කළේද එය කිසිම භාෂාවකින් කියවිය නොහැකි එසේම එම අකුර හතර වචනයක්, නාමයක් ලෙස ශබ්ද කළ නොහැකි නිසාය. නික්මයාම ගමන පුරාම ඔවුන් මුහුණ දුන්, පසුකළ සෑම අත්දැකීමකදීම (තනිභාවය, වේදනාව,අසරණකම, පීඩාව) පිතෘක සෙනෙහසකින් යුතුව ඔවුනට ප්‍රේම කළ දෙවියන් වහන්සේ ඔවුන්ගේ අබ්බා තාත්තා බව, අබ්බා අම්මා බව ඔවුහු අත්දුටුවහ.

**(ඇ)** පහතින් ඇති ශුද්ධ ලියවිලි කොටස් පළමුව කුඩා සංඝ තුළ බෙදා ගැනීමට යොමු වන්න. පසුව වචනයේ සේවකයා විසින් තහවුරු කරමින් දේව මාතෘත්වයේ හා පිතෘත්වයේ ලක්ෂණ හඳුනා දීමට යොමු වෙමු.

උදා:- **i** හොසියා 11:1-4

ඊශ්‍රායෙල් බාලවියේදී මම ඔහුට ප්‍රේම කළෙමි...
ළදරුවෙකු ඔසවන සේ මම ඔවුන්ව මාගේ මුහුණට ගතිමි.
පහතට නැමී ඔවුන්ට කෑම කැව්වෙමි...
සිය මව තම දරුවන්ට දක්වන සෙනෙහසම දෙවියන් වහන්සේ නමැති අබ්බා අම්මා තුළින් ප්‍රකාශ වන අයුරු හොසියා දිවැසිවරයාගේ ප්‍රකාශනයෙන් අපට පැහැදිලි වේ.

**ii** යෙසායා 66:7-13

දෙවියන් වහන්සේ තෝරාගත් ජනතාව ඔවුන් වහන්සේව ප්‍රතික්ෂේප කරන විට, පිටුපා යන විට ලුහුබඳින ප්‍රේමයකින් ඔවුනට ප්‍රේම කරමින් පිතෘක සෙනෙහසින්, මාතෘක සෙනෙහසකින් සමාව දෙමින්, කරුණාව පාමින් දයානුකම්පාවේ හදවතින් ඊශ්‍රායෙල් ජනතාවට ප්‍රේම කළ දෙවියන් වහන්සේ අබ්බා අම්මාය - අබ්බා තාත්තාය.
".... මවක ඇගේ දරුවා සනසන්නාක් මෙන් මම නුඹලා සනසන්නෙමි..."

**iii** යෙසායා 40:11

එඬේරෙකු සේ තම රැළ රැකබලා ගන්නාවූද පෝෂණය කරන්නාවූ ද දෙවියන් වහන්සේ ඊශ්‍රායෙල් වංශය නැමති බැටළු රැළ තණබිම් කරා රැගෙන යන තාත්තා කෙනෙකු සේම පැටවුන් ප්‍රසූත කර තම ලේ කිරට හරවා බොන්නට දෙන එඬේර අම්මා කෙනෙකු සේ සිය රැළ පෝෂණය කරයි. උන් ළයෙහි හොවාගෙන මවකගේ සෙනෙහස තෑගි කරයි.

**iv** යෙසායා 49:15

මවකට තම කුසින් වැදු දරුවා අමතක කළ හැකිද? මනුෂ්‍ය මවක් එසේ කළද අබ්බා අම්මා වන දෙවියන් වහන්සේ කිසිදා තම දරුවන් අත්නොහරින බව යෙසායා දිවැසිවරයා

පවසනුයේ අබ්බා අම්මා වන දෙවියන් වහන්සේ තම දරුවන්ට දක්වන ආදරය එතරම්ම අසීමිත බව දක්වමිනි.

## 04. අප දෙසට :

- අපි දෙවිඳුන්ගේ ප්‍රේමය අදහමින් ඒ ප්‍රේමයට විවෘත වෙමින් එයින් ලබන බලයෙන් එම ප්‍රේමයට ප්‍රති ප්‍රේමය දක්වන්නට ඉගෙන ගනිමු. මවකගේ උණුසුම් හෘදයාංගම ප්‍රේමය අත්දකිමින් අපි මේ වසර පුරාම "අම්මා" කියා දෙවිඳුන් අමතමු. එලෙසම මුහුකුරා ගිය ප්‍රේමයේ ලක්ෂණ අත්දකිමින් "තාත්තා" කියා හද පත්ලෙන් මුමුණමු. තම දරුවන්ගේ ආදරණීය ඇමතුමෙන් ඔවුන් වහන්සේ මහත් සේ සොම්නස් වනු ඇත.

**සාකච්ඡාව සඳහා**

- ප්‍රසාද ස්නාපනීය කැඳවීම තුළ දේව පුත්‍රභාවයට කැඳවීම ලැබූවන් වූ අප ක්‍රිස්තුස් වහන්සේ කරණකොටගෙන දෙවියන් වහන්සේට 'අබ්බා තාත්තේ අබ්බා අම්මේ' යැයි ඇමතීමට වරම් ලදිමු. උරුමයක් ලෙස අප ලැබූ මෙම භාග්‍යවන්ත අත්දැකීම අප ජීවිත තුළ අප අත්දකිනවාද?
- මගේ පවුල තුළ සංඝය තුළ, මා ජීවත් වන විවිධ පරිසරයන් තුළ මගේ තාත්තා, මගේ අම්මා අබ්බා පියාණන් වහන්සේ යැයි සාක්ෂිදරන්නට මා තුළ ඇති අවදි වීම කෙසේද?
- **"මම නුඹලාට ප්‍රේම කළෙමි"යි සමිඳාණන් වහන්සේ වදාරණ සේක. "එහෙත් ඔබ වහන්සේ අපට කෙසේ ප්‍රේම කළ සේක්දැ" යි නුඹලා අසන්නහුය** (මලාකි 1:2)

  එදිනෙදා ජීවිත සිදුවීම් තුළ අපත් ඊශ්‍රායෙල් ජනතාව මෙන් දෙවියන් වහන්සේගෙන් ප්‍රශ්න අසන්නන්ද?

## 05. දවස පුරා :

- මවක සිය කුස දැරූ දරුවා අමතක කළත් සදා නොවෙනස් ප්‍රේමයකින් අපට ප්‍රේම කරන අබ්බා තාත්තා වන අබ්බා අම්මා වන දෙව් මහෝත්තමයාණන් වහන්සේගේ අසීමිත ප්‍රේමය එදිනෙදා ජීවිත සිදුවීම් තුළද අත්දකිමු.
- මනුෂ්‍ය මවකගෙන් හා මනුෂ්‍ය පියෙකුගෙන් උපත ලැබූවකු

වුවද අපේ තාත්තා, අපේ අම්මා අබ්බා පියාණන්වහන්සේ බව අත්දකිමින් දවස පුරා ප්‍රශංසා කරමු.

## 06. අවසාන ප්‍රශංසාව:

පුබුදු ගී අංක 158 "මවකට හැකි වෙද..."

**********************

# පස්වන පෙරමඟ සූදානම
# ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිතය තුළ අත්දුටු
# දේව මාතෘත්වය හා පීතෘත්වය

## 01. ආරම්භක ප්‍රශංසාව :

* දෙවියන් වහන්සේ යනු නිරන්තරයෙන්ම ප්‍රේම කරන තැනැන් වහන්සේ ය. ඒ මන්ද, "දෙවියන් වහන්සේ ප්‍රේමය වන බැවිනි"(1ජුවාම් 4:8) ඔවුන් වහන්සේ සිය මැවිල්ලට ප්‍රේම කරන අතර, තමන් වහන්සේගේ ස්වරූපයට මැවූ මිනිසාට දක්වන්නේ අති මහත් ප්‍රේමයකි. මිනිසා කොපමණ වරක් දෙවියන් වහන්සේට පිටුපා ඈත් වන්නේ ද එපමණ වරක් ඔවුන් වහන්සේ ලුහුබඳින ප්‍රේමයකින් ඔහු සොයා එන්නේ ඔවුන් වහන්සේට ප්‍රේම නොකර සිටිය නොහැකි බැවිනි.
* ඒ මිනිසා හොඳ නිසාවත්, යහපත් නිසාවත් නොව දෙවියන් වහන්සේ තුළ මිනිසාට ඇති ආදරය මුල්කර ගෙනය. කොපමණ වරක් පිටුපා ඈත්ව ගියද කොන්දේසි විරහිතව ඔහු සොයා යමින් ඔහුව තමන් සතු කරගන්නේ දෙවියන් වහන්සේ කිසිවෙකුට සම කළ නොහැකි වෙනස් කෙනෙකු බැවිනි.
* ඒ ප්‍රේමයාණන් වන දෙවියන් වහන්සේට අපට කළ හැකි එකම දෙය ඔවුන් වහන්සේට නමස්කාර කිරීමත්, ප්‍රශංසා කිරීමත් පමණි.

  පුබුදු ගී අංක 160 "ඔසොවා යන සේ පැටවුන් ...." ගීය සමඟින් ප්‍රශංසාවට ඇතුළු වෙමු.

## 02. ආපසු බැලීම

- පීතෘක සෙනෙහසකින් අපව රැකබලා ගන්නාවූ ද පෝෂණය කරන්නාවූ ද අබ්බා තාත්තාගේ ආදරය, මාතෘක සෙනෙහසකින් අපට කරුණාව දයාව පාන, අපව සනසනු ලබන අබ්බා අම්මාගේ ආදරය ඉතා සමීපව අත්දකින්නට ඔබ අවදි වුවාද?
- ආදරය අහිමි වීම නිසා අප ජීවිත තුළ අත්දකින විවිධ වේදනාකාරී තත්ත්වයන් තුළ දේව ආදරය අපව සුව කරන බව, නිදහස් කරන බව අත්දකින්නට හැකිවී තිබේද?

## 03. දවසේ සුපුවත :

(අ) * ජේසු සමිඳුන් ජොර්දාන් නදිය තුළදී ලද දේව පුත්‍රභාවයේ අනන්‍යතාවයෙන් වශී වූ සේක. ඒ සමඟම තමන් වහන්සේ අවට සිදුවන සෑම දෙයක් තුළින්ම අත්දකින්නට වූයේ මහෝත්තමයාණන්ගේ තේජාලංකාරයත්, ඔවුන් වහන්සේගේ පිතෘක, මාතෘක ආදරය හා ගැඹුරු සුරක්ෂිත භාවයත් ය. ඔවුන් වහන්සේ පියාණන් වහන්සේගේ පූර්ණ ප්‍රේමය අත්දුටු සේක.

* ශුද්ධාත්මයාණන් වහන්සේ ඔවුන් වහන්සේව පාළුකරයට ගෙන ගිය සේක. එය දීර්ඝ කාලයක් වුවද (දින 40) යාච්ඤාවෙන් හා උපවාසයෙන් ද නපුරා සමඟ පොර බදිමින් , නපුරා පරාජය කරමින් "පුතුනි මගේ පුතුනි මගේ" යන ආදර හඬ සමඟින් අබ්බා පියාණන් වහන්සේගේ ශුද්ධවූ පවිත්‍ර ප්‍රේමයේ හිමිකරුවාණන් වූ සේක.

* ගැළවීමේ දූත කාර්යය අරඹමින් එතෙක් ජුදා සමාජය තුළ දෙවියන් වහන්සේ පිළිබඳව ඇති අවබෝධය උඩු යටිකුරු කරන සේක. ලෝකයා විසින් තමන් වහන්සේව හඳුන්වා දී තිබුණු 'වඩුවාගේ පුතා' වෙනුවට නව අනන්‍යතාවයෙන් අයිති කර දුන් "දෙවියන් වහන්සේගේ ප්‍රසන්න පුතා" තමන් බව නොපැකිලව සමාජයට හඳුන්වා දෙන සේක. සිය පියාණන් වූ දෙවියන් වහන්සේ භයානක උදහසේ දෙවි කෙනෙකු නොවන බවත්, දිවා රෑ නොනිදා අප සමඟ සිටිමින් ආදරයෙන් සුරක්ෂිත කරන අපගේ අබ්බා තාත්තා - අබ්බා අම්මා බවට ඉගැන්වූ සේක. ඔවුන් වහන්සේගේ මුහුණ දැකීමට ද, නාමය උච්චාරණය කිරීමට ද බිය වූ ජනතාවට දෙවියන් වහන්සේට 'අබ්බා පියාණෙනි, අබ්බා මෑණියෙනි' කියා ඇමතීමේ තමන් සතු වූ ස්වර්ග රාජ්‍යයේ අයිතිය සාංඝික කර ගත් සේක. (ශු.මතෙව් 6:9-13)

(ආ) ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිතය තුළින් අනාවරණය වූ පියාණන් වහන්සේගේ පිතෘක හා මාතෘක ආදරයේ ලක්ෂණ අද දින හඳුනා ගැනීමට යොමු වෙමු. මෙම සුවිශේෂ පාඨයන්හි ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිතය තුළ පිතෘක, මාතෘක ආදරය පිළිබිඹු වන අවස්ථා පිළිබඳව බෙදා ගන්න.

i පළමුව කුඩා සංඝ තුළ බෙදා ගන්න. පසුව වචනයේ සේවකයා තහවුරු කිරීමට යොමු වන්න.
(වචනයේ සේවකයා මෙම සුවිශේෂ කොටස් කියවා යාච්ඤා කර සූදානම්ව පැමිණෙන්න.) ශු.මතෙව් 20:1-15 -

* එදා සමාජය තුළ පුද්ගලයා සතු හැකියාවන් හා දක්ෂතාවයන් අනුව ද සමාජය තුළ පැවති පිළිගැනීම් හා සමාජ තත්ත්වයන් හමුවේද එක් එක් පුද්ගලයාගේ ශාරීරික දුබලතා හා රෝගී තත්ත්වයන් අනුවද විවිධ අයුරින් බෙදා වෙන්කර තිබුණි.
* ඕනෑම ඉඩම් හිමියෙකු තම කුලීකරුවා ලෙස උදෑසනම වැඩට සපයාගනු ලබනුයේ දක්ෂතාවය හා හැකියාවෙන් සපිරුණු පුද්ගලයාව ය.
* සවස් වනතෙක් මංසන්ධියේ සිටගෙන සිටින කුලීකරුවා කිසිවකුගේ නෙත නොගැටෙනුයේ ඔහු සතු හැකියාවන්; දක්ෂතාවයන් නොමැතිකම හෝ වෙනත් ශාරීරික දුබලතාවයකින් පෙළීම නිසාය.
* උපමාවේ සඳහන් ඉඩම් හිමියා වන දේව රාජ්‍යයේ පාලකයාණෝ අළුයම පටන් සවස පහ වන තෙක් මංසද්ධියේ සිටි කුලීකරුවන් තම මිදි වත්තේ සේවය සඳහා යවනු ලබනුයේ ඉමහත් වූ දයා කරුණාවෙනි.
* එලෙසම දවසේ වේතනය ලෙස ලබා දෙන රිදී කාසියේ කුලිය සියල්ලන්ටම එක සමානව ලබා දීමට යොමු වන්නේද දෙමාපිය දෙදෙනා හැම දරුවන්ටම එක ලෙසම ආදරය කරන අයුරිනි.
* පියාණන් වහන්සේගේ පූර්ණ ප්‍රේමය නිති අත්දුටු ජේසු සමිඳාණෝ ඔවුන් වහන්සේගේ පිතෘක හා මාතෘක ආදරයේ ස්නේහයෙන් සියල්ලන්ට එක සමානව ප්‍රේම කරන සේක. "ඔබට ගෙවූ ලෙසම මේ අන්තිමයාටත් ගෙවීම මාගේ කැමැත්තය... මා කාරුණික බැවින් ඔබ ඊර්ෂ්‍යා වන්නේ මන්දැ"යි ඇසීය (ශු.මතෙව් 20:15).

ii ශු.මාක් 6:30-44 (පන්දහසකට කෑම දීම)
* ශ්‍රාවකයන් අත්දුටු විඩාබර බව හා වෙහෙසකාරී බව දුටු ජේසු සමිඳාණෝ ඔවුන් විවේක ගැනීම සඳහා යොමු කරනුයේ පිතෘක හා මාතෘක සෙනෙහසිනි. සැදැහැවත් ජනතාව පිළිබඳ නොසිතා තම ශ්‍රාවකයන් කෙරෙහි උපන් මහත් වූ සෙනෙහසිනි.

* තමන් වහන්සේ විසින් ගනු ලැබූ තීරණයට සිය සේවය ලබන්නට පැමිණෙන සෙනඟම හරස්වන අවස්ථාවේදී ඔවුන් වහන්සේ ගනු ලැබූ තීරණය වෙනස් කරනු ලබති. "මහා පිරිසක් දැක එඬේරෙකු නැති බැටළුවන් වැනි වූ ඔවුන්ට අනුකම්පා කොට ඔවුනට බොහෝ දේ උගන්වන්නට පටන් ගත් සේක." (ශු.මාක් 6:34)
* මෙහිදී සිදුවූයේ ජනතාවට අනුකම්පා කිරීමට වඩා විශාල දෙයක් බව මුල් පිටපත්හි භාවිතා වන ස්ප්ලග්ක්නිසොමායි (Splagchnizomai) යන ග්‍රික් වචනයෙන් පෙනේ. මෙහි අර්ථය වනුයේ යටිබඩය. "කරුණා දයාව" සඳහා හෙබ්‍රෙව්වරුන් භාවිතා කළ ගර්භාෂයට පාවිච්චි කළ 'රකාමිම්'(Rächamim) යන වචනයේ අර්ථය මෙහිද ගැබ්ව ඇත.
* මේ අනුව මෙම අර්ථය දෙස බලන විට (ශු.මාක් 6:34) පෙනෙනුයේ බැටළු දෙන නැති බැටළු පැටවුන් මෙන් වූ ඔවුන් දැක කිරි එරී බොහෝ කිරි පොවා ඔවුන්ට දිය යුතු පෝෂණය දෙමින් ඔවුන් ශක්තිමත් කල බවය. මේ අනුව දෙවියන් වහන්සේ බැටළුවන්ට තණ කොළ නොව කිරි දෙනු ලබනුයේ ඔවුන් වහන්සේ තුළ උපන් මාතෘත්වයේ සෙනෙහසිනි.
* ජේසු සමිඳාණන්ද 'ඔබම ඔවුන්ට කෑම දෙන්නැයි වදාරනුයේ 'ඔවුන් වහන්සේ තුළ උපන් මහත් වූ ස්නෙහයෙනි. ඒ අනුව ඔවුන් වහන්සේම තම බැටළු රැළ පෝෂණය කරන සේක.
* මේ අනුව මෙම සිදුවීම තුළ ඇති මාතෘක ආදරය අපට මෙලෙස හඳුනාගත හැකි වේ.

iii ශු.ජුවාම් 10:1-5, 7-15
* යහපත් බැටළු එඬේරාට යහපත් එඬේරා යැයි කියනුයේ, ඔහුට එඬේරෙකු ලෙස පමණක් නොව එඬේරියක ලෙසද කල්පනා කරන්නට සිතෙන්නට පුළුවන්කම තිබෙන නිසාය.
* එඬේරා මමයි කියා තාත්තා කෙනෙකුට කිව හැකි වුවත් 'දොරටුව මමයි' කියා කිව හැක්කේ අම්මා කෙනෙකුට පමණි. මිනිස් ජීවයට මිහිමත උපත දීම සිදුවනුයේ ජීවන දොරටුව වන අම්මා මඟිනි. මන්දයත්, ජීවයේ දොර අම්මා ය. එසේ නොමැති නම් මනුෂ්‍යයාට ජන ගඟ ගලන්නට මිහිතලයේ හිරු එළිය දැකීමට වෙනත් විකල්ප මඟක් නොමැත.

* දෙවියන් වහන්සේ අපව මැව් තැනැන් වහන්සේ යයි කී කල එහි තේරුම ඔවුන් වහන්සේ අපව වැදූ කෙනා ද යන්නය. වැදූ අම්මාට දරුවා ගැන ඇති කැක්කුම ක්‍රිස්තු එඬේරාණන්ගේ වචන වලින්ම පෙනේ.
* මට පළමුව පැමිණි සියල්ලෝම සොරුද කොල්ලකන්නෝද වෙති. **".... සොරා එන්නේ සොරකම් කරන්නටත්, මරන්නටත්, විනාශ කරන්නටත් පමණි. මා පැමිණියේ ඔවුන්ට ජීවනය ලැබෙන පිණිසත් සපුරාම එය දෙන පිණිසත් යැ"යි** ඔවුන් වහන්සේ පවසනුයේ පියාණන් වහන්සේ ප්‍රසූත කළ දරු පැටවුන්ගේ මිදීම ගැන ඔවුන් වහන්සේට දැනෙන ප්‍රසව ආවේගයේ ප්‍රබලතාව නිසාය.
* රැළ දක්කාගෙන තණ ගොල්ලට යන එඬේරා සැබවින්ම පියෙකුට වඩා පැටවුන් ප්‍රසූත කර තම තනපුඩු උඩ උන්ට කිරි දෙන එඬේර අම්මා කෙනෙකුගේ රූපය මෙම උපමාව වඩාත් පුළුල්ව දැකීමට පිටුවහලකි.

## 04. අපගේ පුත්‍රභාවය :

ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිතයේ ඔවුන් වහන්සේ දෙවියන් වහන්සේගේ පූර්ණ ප්‍රේමය (පිතෘක - මාතෘක) නිරන්තරයෙන් අත්දකින්නට විය. අන් අය වෙත ද ගලා යන්නට විය. අපගේ ජීවිතයේ පසුකරන අභියෝගාත්මක අත්දැකීම් හමුවේ දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාසය කෙලෙසද?

## 05. බෙදා ගැනීම :

1. මගේ ජීවිත සිදුවීම් හමුවේ ඔවුන් වහන්සේගේ පිතෘක හා මාතෘක ආදරය මා කොතෙක් දුරට අත්දකිනු ලබන්නේද? (ඔබගේ ජීවිතයේ දෙවියන් වහන්සේ මාගේ තාත්තා / අම්මා යයි අත්දකිනු ලැබූ විශ්වාසයේ අත්දැකීම් බෙදා ගන්න.)

2. ඔබ අම්මා කෙනෙකු හෝ දුවෙක් නම් ඔබගේ ජීවිතය තුළින් පිතෘක ආදරය අන් අය අත්දැක තිබේද?
3. ඔබ තාත්තා කෙනෙකු හෝ පුතෙකු නම් ඔබගේ ජීවිතය තුළින් මාතෘක ආදරය අන් අය අත්දැක තිබේද?

**06. හෙට දවස පුරා:**

1. ජේසු සමිඳාණන් ප්‍රකාශ කරන ඉගැන්වීම් හා වෙනත් උපමාවන් තුළද, ප්‍රාතිහාර්යයන් හා ජීවිත සිදුවීම් තුළින් අන් අය අත්දුටු පිතෘක හා මාතෘක ආදරයේ අත්දැකීම් ශු.ලියවිල්ල ඇසුරින් හඳුනා ගන්න.

2. අබ්බා ... අබ්බා ... පියාණෙනි ///
   අබ්බා මගේ පියාණෙනි

   අබ්බා ... අබ්බා... මෑණියනි ///
   අබ්බා මගේ මෑණියනි

   ගීතිකාව දවස පුරා මුමුණන්න.

3. පියාණන් වහන්සේගේ පිතෘක හා මාතෘක ආදරය දවස පුරා අත්දකින්න.

**********************

# සයවන පෙරමඟ සූදානම
# කුරුස ගසේදී ක්‍රිස්තුන් වහන්සේ තුළින්
# ප්‍රකාශ වූ පිතෘක මාතෘක ආදරය

## 01. ආරම්භක ප්‍රශංසාව :

* ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ජෝර්දාන් නදියේදී ස්නාවක ජොහාන් තුමාගෙන් ලද බෞතිස්ම ස්නාපනයත් සමඟ ලැබුවාවූ ශුද්ධාත්ම ස්නාපනය හරහා අත්දැක්කාවූ පුත්‍රභාවයේ අත්දැකීම පූර්ණත්වයට පත් කරනු ලැබුවේ ස්වකීය ශරීරය කුරුසිය මත යාගයක් කොට පුද කරමිනි.
* දෙවියන් වහන්සේ මනුෂ්‍යයාට දැක්වූ පිතෘක මාතෘක ආදරය පූර්ණව ප්‍රකාශ වූයේ කුරුස ගසේ ක්‍රිස්තුන් වහන්සේ හෙළුවාවූ ශ්‍රී රුධිරය කරණකොට ගෙන වන අතර ඒ හරහා බිහිවූ ශුද්ධවූ සභාවට සදාකාලයටම දෙවියන් වහන්සේ අබ්බා අම්මා-අබ්බා තාත්තා වන සේක.
* මෙලෙසින් ජේසුස් සමිඳාණන් කුරුසියේ යාගය තුළින් අප වෙත දැක්වූ මේ සුවිශේෂී ප්‍රේමය උදෙසා අප සැම ප්‍රීතිමත් හදින් යුතුව ඔවුන් වහන්සේට ස්තූති ප්‍රශංසා කරමු.
  පුබුදු ගී අංක 42 "අහස පොළොව අතර රැඳී...."

## 02. ආපසු බැලීම :

1. ඔබ තුළින් අද දවසේදී පියාණන් වහන්සේගේ පිතෘක ආදරය හා මාතෘක ආදරය අන් අය අත්දකිනු ලැබුයේද?

2. දේව ආදරය මා තුළින් ගලා යෑමට බාධා කරන මගේ ජීවිතයේ තිබෙන දුබලකම් හඳුනාගෙන තිබේද? විශේෂයෙන් අප කථා කරන මුල් අගුන පව්, ඇතුලාන්ත තුවාල, ඝනයේ ස්වභාවය, මතකයන්, පුරුදු /ඇබ්බැහිවීම් අන් අය වෙත දේව ප්‍රේමය ගලා යෑමට බාධාවක්ය. ඒ පිළිබඳ ඔබගේ අවදිවීම කෙබඳුද?

## 03. දවසේ සුපුවත :

(අ) මවක් ඇගේ ගර්භයේ සිටින දරුවා ප්‍රසූත කරන මොහොත උදා වන තුරු බලා සිටිනුයේ විලිරුදා විඳිමිනි. ඇයගේ හදවතේ ඇති පැතුම වනුයේ මේ වේදනාව තව කොපමණ වෙලාවක් විඳින්නද යන්නය. නමුත් තම කුස තුළ දරුවා දකින්නට ආශාවෙන් හා බලාපොරොත්තුවෙන් යුතුව ඇගේ වේදනාව යටපත් වේ. එහෙත් උග්‍ර වී නැවත මතු වේ. වේදනාව දරා ගත නොහැකි තැන ඈ මොර ගසනුයේ "මේ කුසලාන මාගෙන් ඉවත් කළ හැකිනම් එසේ වේවා" යනුවෙනි. එහෙත් ඈ තුළින් උපත ලබන්නට තතනන නව ජීවයේ ස්පන්දනය දැනෙත්ම ප්‍රේමයෙන් ඇගේ හද පිරී ගොස් "මේ කුසලානය පානය කිරීම තුළින් ඔබ මහිමයට පැමිණේවා"යි නැවතත් මොරගසනු ඇත.

අළුත් ජීවයක් බිහිකිරීම කෙතරම් අපහසු ද? මවක් වීම මොනතරම් වේදනා සහිතද? ඈ තුළ තිබෙන ශාරීරික ශක්තියෙන් ඒ වේදනාව විඳගත නොහැකිය. එහෙත් ඈ තුළින් උපත ලබන නව ජීවය තුළින් පිටාරා ගලන ප්‍රේමය ඒ සඳහා ඇයව නිති දිරිමත් කරනු ඇත.

ඈ ශාරීරිකව අත්දකිනුයේ කෙලින් සිටීමටත් බැරි වේදනාවකි. පසෙකින් ඇසෙනුයේ 'තව මොහොතයි' ඔබට ඇත්තේ යන හඬකි. ඒ නිමේෂයේදී කෑ මොර ගසන්නේ නැතිව ඈ අත්දකින වේදනාව යටපත් වනුයේ ප්‍රේමය මුසු වූ බලාපොරොත්තුව නිසාය. ඒ මොහොතේම ඇසෙනුයේ 'දරුවා හඬන' ශබ්දය ය. මේ මොහොතේ ඈට දැනෙනුයේ ශාරීරික පහසුවකි. මානසික සතුටකි. ආත්මික සැනසීමකි. (ශු.ජුවාම් 16:21) වේදනාව හමාර වී ඇති මේ මොහොතේ එහි ඵල රස භුක්ති විඳිනුයේ ඈ පමණක් නොව ඇයට ආදරේ කරන, ඈ සමග සමීප සබඳතා පවත්වන නෑ හිත මිතුරන් පමණකුත් නොව නව උපත ලැබූ කුඩා බිළිඳා නෙත ගැටෙන සියල්ලන්මයි.

දෙවි පියාණන් තම ඒක ජාතක පුතණුවන්ව අප වෙත ප්‍රදානය කිරීම ප්‍රසව වේදනාවේ ප්‍රතිඵලයකි. එබැවින් කුරුස ගසේදී සමිඳාණන් අත්දැක්කාවූ වේදනාව අපට අනාවරණය කරනුයේ දෙවියන් වහන්සේ අප වෙනුවෙන් කුරුස ගස මත ක්‍රිස්තුන් වහන්සේ සමඟින් වේදනා විඳින බවය. දේව පුත්‍රයාණන් අපව නව මිනිසුන් ලෙස බිහි කරනු සඳහා කුරුසිය මත විඳ දරා ගත්තේ

දැඩි ප්‍රසව වේදනාවකි. කුරුස ගසේදී සමිඳුන්ගේ රිදුම විඳුම තුළ අප වෙනුවෙන් ප්‍රසව වේදනා විඳින්නේ අබ්බා අම්මා වූ දෙවි මහෝත්තමයාණන් ම ය. එය මිනිස් මවකගේ ප්‍රසව වේදනාව ඉක්මවා යන්නකි. ඒ තුළින් සිදු වූ උපත සාමාන්‍ය දරු උපතකට වඩා පුළුල් වූවකි.

(ආ) ජේසු ක්‍රිස්තුන් වහන්සේ පියාණන් වහන්සේගේ පිතෘක මාතෘක ආදරය ගැඹුරින් අත්දැක්කේ කුරුස ගසේදීය. ක්‍රිස්තුන් වහන්සේ සැබෑ මනුෂ්‍ය පුත්‍රයා ලෙස ඉතා කඨොර වූ දුක් ගාවිනා වලට පාත්‍ර වෙමින් කුරුස ගසේ මරණයට මුහුණ දුන් සේක. ඔවුන් වහන්සේ කුරුස ගසේදී විඳි වේදනාව විග්‍රහ කිරීමට මනුෂ්‍ය වචන ප්‍රමාණවත් නොවන තරම්ය. ගැඹුරුම තනිභාවය, අත්හරිනු ලැබීම, නින්දාව, ප්‍රතික්ෂේපය, දරාගත නොහැකි ශාරීරික වේදනාව මේ සියල්ල කැටිවුනු අති භයානක අත්දැකීමට මුහුණ දෙමින් පියාණන් වහන්සේ මහිමයට පත්වන පැය පැමිණ ඇතැයි ඔවුන් වහන්සේ පවසන සේක.

* කුරුස ගසේ අත්විඳිනට යන මේ වේදනාත්මක බිහිසුණු අත්දැකීම දරාගත නොහැකිව "මේ කුසලාන මා කෙරෙන් ඉවත් කළ මැනව" (ශු.මාක් 14:36)යිද කුරුස ගස තුළ "මාගේ දෙවියනි, මාගේ දෙවියනි ඔබ මා අත්හැරියේ මක්නිසාද?" (ශු.මතෙව් 27:46) යනුවෙන් මොරගැසුවද ඒ නිමේෂයේදීම නැවතත් "පියාණෙනි, ඔබගේ හස්තයට මාගේ ආත්මය භාර දෙමි"යි (ශු.ලූක් 23:46) වදාරනුයේ තමන් තුළින් උපදින නව ජීවයේ ස්පන්දනය ඔවුන් වහන්සේ වේදනාත්මක පැය තුළ අත්වින්ද නිසාවෙනි.

* කුරුස ගසේදී "ඔබගේ හස්තයට මාගේ ආත්මය බාර දෙමි"යි (ශු.ලූක් 23:46) ද "සියල්ල නිම වී ය"යි (ශු.ජොහාන් 19:30) ද වදාරමින් ක්‍රිස්තුන් වහන්සේ පවසා සිටියේ අබ්බා පියාණන් තමන් වහන්සේගෙන් බලාපොරොත්තු වූ දූත කාර්ය නිමා කළ බවයි. දේව තාත්තාගේ සිහිනය ඉටු වී තමන් මෙලොවට එවා වදාළ පියාණන් වහන්සේ ද අත්දුටු ප්‍රසව වේදනාවේ ප්‍රතිඵලය වන දේව පුත්‍රභාවය අත්දකින නව මිනිසුන් බිහිවී අවසාන බැවින් මෙවන් වදන් ඔවුන් වහන්සේ තුළින් ද නික්මිනි.

(ඇ) මවක් ඇගේ ගර්භයෙහි සිටින දරුවා වෙනුවෙන් ඉමහත් දුක් වේදනා උසුලන්නේ යම්සේ ද ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ කුරුස ගසේ එල්ලී හිඳිමින් ඔවුන් වහන්සේගේ ගර්භය තුළ දරා සිටි ශුද්ධවූ සභාව නමැති දරුවා වෙනුවෙන් ඉමහත් වේදනා ඉසිලූ සේක. දැඩි ප්‍රසව වේදනා විඳිමින් ශු.සභාව නමැති දරුවා බිහි කළ සේක. ක්‍රිස්තුන් වහන්සේ තුළ ශු.සභාව ජීවමාන විය.

හෙබ්‍රෙව් 10:20 "උන්වහන්සේ ස්වකීය ශරීරය නමැති තිරය මැදින් අප උදෙසා අලුත් ජීවමාන මාර්ගයක් විවෘත කර දුන් සේක." එය ඔවුන් වහන්සේම පැවසූ පරිදි, "ස්ත්‍රියකට ප්‍රසව මොහොත පැමිණි කල ඇගේ වෙලාව පැමිණ තිබෙන බැවින් ඈට දුක් වේදනා ඇති වේ. එහෙත් ඈ දරුවා බිහි කල පසු ලෝකයට දරුවෙක් උපන්නේය යන ප්‍රීතිය නිසා වේදනාව අමතක කරන්නීය" (ශු.ජුවාම් 16:21) යන වචනගත වූ අත්දැකීමකි.

## 04. අප දෙසට :

* ජේසු සමිඳුන් කුරුසිය මත අත්දැක්කේ දැඩි ප්‍රසව වේදනාවකි. එය මිනිස් මවකගේ ප්‍රසව වේදනාව ඉක්මවා යන්නකි. ඒ තුළින් සිදු වූ උපත සාමාන්‍ය දරු උපතකට වඩා පුළුල් වූවකි. එය මුළු මිනිස් සංහතිය කෙරෙහි බලපානුයේ අපිදු කිතු සමිඳුන් තුළ නව මිනිසත් බවට හෙවත් දේව පුත්‍රභාවය අත්දකිමින් දේව පුතුන් ලෙස සාක්ෂි දැරීමෙන් ය.

(අ) i ඔවුන් වහන්සේ දිනා දුන් දේව පුත්‍රභාවයේ නව මිනිසත් බව ඔබ මා කොතෙක් අත්දකින්නේද?
ii දේව පුත්‍රභාවය අත්දකින ජීවිතයක් තුළින් නිතැතින්ම ගලා යනුයේ දේව රාජ්‍යයේ වටිනාකමය. ඔබගේ ජීවිතය තුළින් දේව රාජ්‍යයේ වටිනාකම් ගලා යන්නේ ද?

(ආ) i මුළු විශ්වයම දේව පුත්‍රභාවයට එසවෙනුයේ ඔවුන් වහන්සේගේ මහිමාන්විත දෙවන පැමිණීම තුළින් ය. (නව අහස හා නව පොළොව) (එළිදරව්ව 21:1-2) එය සිදුවන දවස දක්වා මුළු විශ්වයම ප්‍රසව වේදනාවෙන් පෙළේ. එලෙස ප්‍රසව වේදනාවෙන් පෙළෙනු ලැබීම දෙවියන් වහන්සේගේද කැමැත්ත වනු නිසැකය.

(රෝම 8:21-22) මුළු විශ්වය නවතාවය අත්දකින නව මැවිල්ල වනු සඳහා අප විසින් ද අත්දැකිය යුතු ප්‍රසව වේදනාව දරු උපතකදී අත්විඳින ප්‍රසව වේදනාවට වඩා බලවත්ය. ඒ සඳහා මුළු විශ්වයම ප්‍රසව වේදනාවෙන් කොඳුරන හඬ මට ඇසේද?

ii සමාජ පාපය හා ව්‍යුගත පාපයන් දකින තැනද සමාජ ක්‍රමය නිසා මුහුණ දෙන අසාධාරණයන් හා පරිසර විනාශයන් පෙනෙන තැනද පිබිදුනු කිතුනුවෙකු ලෙස මා තුළ ඇති ප්‍රසව වේදනාවේ බලාපොරොත්තු (2පේදුරු 3:13) කෙබඳුද?

## 05. සාකච්ඡාව සඳහා :

* පියාණන් වහන්සේගේ පිතෘක මාතෘක ආදරයට විවෘත වූ ජේසු සමිඳාණන් ඒ ආදරයට ප්‍රතිචාරය දැක්වූයේ මුළු ජීවිතයම දේව රාජ්‍යය උදෙසා පූජා කරමිනි. ක්‍රිස්තුන් වහන්සේගේ කුරුසියේ යාගය තුළින් අප වෙත ගලා එන පිතෘක මාතෘක ආදරයට අපගේ ප්‍රතිචාරය කෙසේද?
* දේව රාජ්‍යය උදෙසා කැමැත්තෙන් දුක් විඳින්නට, ක්‍රිස්තුන් වහන්සේ සමඟ හිඳිමින් කුරුසිය පාමුල සංඝයේ අත්දැකීමට ඇතුළු වෙන්නට, දේව පුත්‍රභාවය තුළ මා කොතෙක් දුරට අවදි වෙනවාද?

## 06. හෙට දවස පුරා :

* අපව ජනතාවක් කරන, සභාවක් කරන ක්‍රිස්තුන් වහන්සේගේ පිතෘක මාතෘක ආදරය ප්‍රකාශ කරන, ශ්‍රී රුධිරයේ බලය අත්දකින්නට යොමු වෙමු.
* අප අත්දකින ගැඹුරුම වේදනාව, තනිකම, නින්දාව, ප්‍රතික්ෂේපය තුළත් අපට ආදරය කරන, අපව අගය කරන, අපව පිළිගනු ලබන දෙවි පියාණන් වහන්සේගේ පිතෘක මාතෘක ආදරයට විවෘතව සිටිමු.
* එපීස 1:4 කියවන්න. "අයිති කර ගනිමි මට දුන් ත්‍යාගය ..." (පුබුදු ගී අංක නව 376, පැරණි 364) දවස පුරා මුමුණන්න.

## 07. අවසන් ප්‍රශංසාව :

**අබ්බා තාත්තා** - පුතේ පුතේ පුතුනි මගේ
මට ඇසේ ආදරේ හඬ ඔබේ
පිපාසය ඔබේ මට දැනේ

**අබ්බා අම්මා** - පුතේ පුතේ පුතුනි මගේ
මට ඇසේ ආදරේ හඬ ඔබේ
පිපාසය ඔබේ මට දැනේ

පුතේ පුතේ පුතුනි මගේ
රිදුම විඳුම ඔබගේ කුරුස ගසේ
වේදනාව වී ඇත මගේ
හදවත පසා කර ඇත්තේ
මට දැනේ මට දැනේ
මගේ පුතුනේ ///

පුබුදු ගී අංක 53 "පවිබර අපගේ ගැළවුම සඳහා...."

**********************

# හත්වන පෙරමඟ සූදානම
# දේව මෑණියන් "අබ්බා අම්මා ලෙසත් - අබ්බා තාත්තා" ලෙසත් ආදරය අත්දැකීම

## 01. ආරම්භක ප්‍රශංසාවට යොමුව

භාග්‍යවන්ත අම්මා දෙව් මහෝත්තම අබ්බා තාත්තා කෙරෙහි දැක්වූ විශ්වාසයේ පිපාසය පූර්ණය, අචලය, අමිලය. එතුමියට සිය ජීවිත කාලය තුළදී හා ස්වර්ගාරෝපණය දක්වා තිබූ පිපාසය දෙවිදුන්ගෙන් ලද දීමනාවකි. එතුමිය ලද පිපාසය ගැන පසසමු. අපට ද එවැනිවූ පිපාසයක් අයදිමු.

පුබුදු ගී අංක 365 "නැති ද මට දෙන්නේ...."

## 02. ආපසු බැලීම

* ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ කුරුසිය මත, ගැඹුරුම වේදනාවේ හා තනිකමේ පැයේදී අත්දුටුවාවූ පියාණන් වහන්සේගේ පිතෘක මාතෘක ආදරයේ අත්දැකීමට, ඔබගේ වේදනාවන්හිදී හා තනිවූ අවස්ථාවලදී අවදි වීමට හැකි වූවාද?
* ක්‍රිස්තු සමිඳාණන් කුරුස ගසේ ඉමහත් දුක් විඳ බිහි කළ දරුවා ශුද්ධවූ සභාව බැවින්, එම දෙව් පුත්කමට ඔබින ලෙස ක්‍රියා කරමින් දේව රාජ්‍යය උදෙසා කැප වෙන්නට අපි අවදි වුනෙමුද?

## 03. දවසේ සුපුවත

(අ) * දෙවියන් වහන්සේගේ මාතෘක ප්‍රකාශනයේ මිනිස් ස්වරූපය භාග්‍යවන්ත අම්මා තුළ විද්‍යාමාන වේ. භාග්‍යවන්ත අම්මා දෙස බලද්දී මනුෂ්‍යත්වය සතු දිව්‍යමය කැඳවීමට පූර්ණ ලෙස පිළිතුරු දුන් අයුරු අපට පෙනේ.

* ස්ත්‍රියක් මවක් වනුයේ තම පුරුෂයාට විවෘත වී පුරුෂයා ගෙන් ලබා ගෙන, දරා ගෙන, වර්ධනය කර දරුවෙකුට උපතක් දීමෙනි. බිහි කිරීමෙනි.
* මංගලම් කීමේ මොහොතේ සිට ශුද්ධාත්ම ආගමනය දක්වා එතුමිය දෙවියන් වහන්සේගේ කැමැත්තට මුළුමනින්ම විවෘත වී සිටි කාන්තාවක් වූවාය.
* ආදර්ශවත් මව තම දරුවා දස මසක් කුසේ දරා, වර්ධනය කර

මෙලොව බිහි වූ පසු පියාගේ දෝතට බාර දෙනුයේ පියාගේ නාමය දරමින් ලෝකය තුළ ප්‍රකාශ වීමට ය. ඉන්පසු ලෝකයා හඳුනාගනු ලබන්නේ ද, හඳුන්වන්නේ ද පියාගේ නාමයෙනි. දරුවා පියාගේ නාමය දරමින් ලෝකයට ප්‍රකාශ වේ. හිස්වීම මාතෘත්වයේ ලක්ෂණයයි. එතුමියගේ හිස්වීම සාමාන්‍ය මවකගේ හිස්භාවයද අභිබවා යන්නීය.

* දේව වචනයට විවෘත වූ දේව වචනයාණන්ට මාංශගතවීමට ඉඩ දුන් ඇදහිල්ලේ කර්තෘවරයාණන්ගේ අම්මා එතුමියයි. දෙවියන් වහන්සේගේ වචනය වැටුනු සරු පොළොව දේව මෑණියන්ගේ ශ්‍රී කුසයයි. **"ඔබගේ ශ්‍රී කුසෙහි ඵලය වන් ජේසුස්"** ශ්‍රී වචනයාණන් වූ තම පුතුණුවන්ව පියාණන් වහන්සේගේ මහිමය සඳහා ම කැප කොට ඕ තුමිය මුළුමනින් ම හිස් වූවාය.
* ශ්‍රී වචනයාණන්ගේ අබ්බා තාත්තා අබ්බා අම්මා යන අත්දැකීම එතුමිය තම කුස තුළ දරා සිටින්නීය.
* එතුමියගේ ගර්භයෙහි මොහොතක් මොහොතක් පාසා නව මසක් තම කුසෙහි වැඩෙන පුතුණුවන්ගේ පියා අබ්බා - තාත්තා බව එතුමිය අත්දකින අතර මාතෘක විපර්යාසයන් තමන් වහන්සේගේ සිරුර තුළ සිදුවෙද්දී... දරු ප්‍රසූතිය, කිරි එරීම, ලේ කිරි වීම යන මාතෘක පදවිය දරන්නට ස්වරූපය දුන්නේ අබ්බා - අම්මා බව අත් දකින්නීය. 'පරිශුද්ධයාණෝ යනු එතුමාණන්ගේ නාමයය' යන අභිරහස්මක භාවය තුළ එතුමිය ගිලී සිටින්නීය. අපි එතුමිය දෙස නෙත සිත හදවත යොමු කරමු.

  පුබුදු ගී අංක 132 පරම දෙව්ඳු....... ගායනා කරමු.

## (ආ) ක්‍රිස්තුන් වහන්සේගේ තිළිණයක් දේව අම්මා

ශු.ජොහාන් 19:26-27 කියවමු.

* පියාණන් වහන්සේ විසින් තමන් වහන්සේට පවරා තිබූ කාර්ය සම්පූර්ණත්වයට පත් කිරීමට පෙර සිදු කළ කාර්යය අපි ඉහත මෙනෙහි කළෙමු.
* **"මෙන්න ඔබේ මෑණියෝ" "ස්ත්‍රිය මෙන්න ඔබේ පුත්‍රයා"** මෙම වදන් විශේෂිත ගැළවීමේ කාර්යයේ අභිරහස ප්‍රකාශ කරන අනාවරණයක වදන් පෙළක් බව 'සුපුවතේ ආනන්දය' අපෝස්තලික අනුශාසනාවේ ෆ්‍රැන්සිස් සුදතුම් පියා එළිදරව් කරයි.

* කුරුසියේ පාමුල නව මැවිල්ල බිහි වීමේ උතුම් හෝරාවේ, ක්‍රිස්තුන් වහන්සේ අපව දේව අම්මාට යොමු කළ සේක.
* ඔවුන් වහන්සේ අපව ඕතුමිය වෙතට රැගෙන ආවේ අපව අම්මා කෙනෙකු නොමැතිව ඉදිරියට ගමන් කරවන්නට ඔවුන් වහන්සේට අවශ්‍ය නොවූ නිසාය.
* සුභාරංචි අභිරහස තුළ අන්තර්ගත දේව මාතෘක ප්‍රතිරූපය ඕතුමිය මගින් ඔවුන් වහන්සේ ජනතාව ඉදිරියේ තැබූ සේක.
* මේ උතුම් ස්ත්‍රී භාවයේ ප්‍රතිරූපයෙන් ව්‍යුක්තව ශුද්ධවූ සභාව සිටීම ක්‍රිස්තුන් වහන්සේගේ කැමැත්ත නොවූ බව සුදතුම් පියා අපට පවසයි.
* අප කතෝලිකයන් ලෙස කොපමණ භාග්‍යවන්තද? දේව මාතෘක ආදරය අපට අත්දකින්නට සලස්වමින් සිය මාතෘක ප්‍රේමයෙන් අප හදවත් විශ්වාසයට විවෘත කරන අම්මා එතුමියයි.
* ජුවාන් ඩිඒගෝ තුමාට පැවසූ සේම මරියෝත්තමාවෝ අප සැමට මාතෘක සහනය සහ ප්‍රේමය පෙන්වමින් අපගේ සවන් වලට මෙසේ රහසින් කොඳුරන්නාහ:
  **"ඔබගේ හදවත් කැළඹීමට ඉඩ නොදෙන්න. මෙහි සිටින ඔබගේ මව මම ම නොවේද?"**
* එසේ පවසමින් ශුද්ධාත්මයාණන් සමඟ දේව අම්මා ජනතාව මධ්‍යයේ සැමවිටම වැඩ සිටින්නාහ. එදා ශුද්ධාත්මාගමනය පතා යාච්ඤා කරමින් සිටි ශ්‍රාවක සංඝය සමඟ ඕතුමූද සම්බන්ධ වූවාහ. (ක්‍රියා 1:14)

## 04. අප දෙසට - (බෙදා ගන්න)

* භාග්‍යවන්ත අම්මා මෙන් අප ජීවිත සිද්ධීන් තුළ දෙවි මහෝත්මයාණන්ව " අබ්බා - තාත්තා, අබ්බා - අම්මා " ලෙස අත්දැක තිබේද? ඒවා මොනවාද? එසේ අත්දැකීමට මඟහැරී ඇති අවස්ථාවන් කොපමණද?
* භාග්‍යවන්ත අම්මා තුළින් ඔබ දේව මාතෘක ආදරය අත්දකින බවට අවදි වී තිබේද?
* ''හිස්වීම'' ''අත්හැරීම'' දේව අම්මා තුළින් පිළිඹිබු වන අත්දැකීම පිළිබඳ ඔබගේ අත්දැකීම බෙදාගන්න.

## 05. අවසාන ප්‍රශංසාව

පුබුදු ගී අංක 229 "හදවත මගෙ සමිඳුන්ගේ ....

## 06. දවස පුරා :

* දෙවියන් වහන්සේගේ මාතෘක ප්‍රේමයේ ප්‍රකාශනය වන භාග්‍යවන්ත අම්මාට පවුලක් ලෙස ජපමාලයක් ඔප්පු කරන්න.
* දවසේ හැකි හැම වෙලාවකම 'නමෝ මරියනි' යාච්ඤාව උච්චාරණය කරන්න.
* මරියනි මාගේ යහපත් මෑණියනි
  අද දින සියළුම පාපයෙන්
  මා රක්ෂා කර ගත මැනව යැයි ගයන්න.
* පිබිදුණු ජනතාවක් ලෙස දේව අම්මාට අපගේ භක්තිය වූ අපගේ කැරිස්මාවේ පළමු අත්දැකීම ශුද්ධාත්මයාණන්ගෙන් පිරීම හා හිස්වීම කෙරෙහි අවදි වන්න.

**********************

# අටවන පෙරමඟ සූදානම
# දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ තුළ පිතෘක - මාතෘක ප්‍රේමය

**01. ආරම්භක ප්‍රශංසාව :**

දෙවියන් වහන්සේ හා සමාන වන්නට තරම් උඩඟු වූ මිනිසාව, පාපය නිසා විනාශ වන්නට ඉඩ නොදී ගළවා ගැනුමට, දෙවියන් වහන්සේ මනුෂ්‍යයෙකු වෙමින් බැහැපත් වූ සේක. සර්ව බලධාරි දෙවියන් වහන්සේ මනුෂ්‍යයාට ඇති ප්‍රේමය කොතෙක් ද, තව තවත් කුඩා වෙමින් සුදෝ සුදු පූපයක් බවට පත් වූහ. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ තුළ දෙවියන් වහන්සේ මවක් මෙන් තම ජනතාව පෝෂණය කරන්නාහ. පියෙකු මෙන් තම දරුවන් රැ කවල් කරමින් ඔවුන් තුළ වැඩ සිටින්නාහ. නිර්දෝෂ සිරකරුවෙකු මෙන් සත්ප්‍රසාද නිවහන තුළ තනි වී සිටින්නාහ. ආහාරයක් වීමේ ප්‍රේමයෙන් නොවටිනා අප වෙතට වැඩම කරමින් අප තුළ වාසය කරන සේක. සර්ව බලැති දෙවියන් වහන්සේ නව මැවිල්ල වූ මිනිසාට, පුත්‍රයන්ට මෙන් දක්වන මේ මහා ප්‍රේමය මුල්කර ගනිමින් අපි ප්‍රශංසාවට යොමු වෙමු.

පුබුදු ගී අංක 129 "පූර්ණයාණෙනි...."

**02. ආපසු බැලීම :**

භාග්‍යවන්ත අම්මා **'පරිශුද්ධයාණෝ එතුමාණන්ගේ නාමයයි'** පසසමින් අබ්බා - තාත්තා, අබ්බා අම්මා ලෙස දෙවි මහෝත්තමයාණන් අත්දුටු අවස්ථා - සිද්ධීන් කිහිපයක් අපි මෙනෙහි කළෙමු. එතුමියගේ ජීවිත ආදර්ශය තුළින් අප ජීවිත හරහාද අබ්බා - තාත්තා, අබ්බා - අම්මා ලෙස දෙවි මහෝත්තමයාණන් අත්දකින්නට පිපාසයක් ඇති කර ගත්තෙමු. එකිනෙකා සමඟ ඔබගේ අවදිවීම බෙදා ගන්න.

**03. දවසේ සුපුවත:**

(අ) දිව්‍ය සත්ප්‍රසාදය, ජේසුස් වහන්සේ දිනූ ගැළවීම නැවත නැවතත් අප තුළ, අප අතර ජීවත් කරවන ප්‍රසාද නිධානයයි. අප ගැළවුම්කරුවාණන් වූ ක්‍රිස්තුන් වහන්සේ විසින්ම අන්තිම

රාත්‍රි භෝජන අවස්ථාවේදී ඔවුන් වහන්සේගේ වචන වලින් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ස්ථාපිත කරන ලදී. (ශු.මතෙව් 26:26-28)

ක්‍රිස්තුන් වහන්සේ තමන්ගේම වූවන් සමග ගැඹුරුතම සම්බන්ධතාවයෙන් යුතුව ගත කළ මොහොත, අවසාන රාත්‍රි භෝජන අවස්ථාවයි. එම ප්‍රේමයේ පැයේදී ප්‍රේමයේ අනගිතම දීමනාව වන දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ස්ථාපිත කරමින්, ප්‍රේමයේ නිර්දෝෂී සිරකරුවෙකු වූයේ, ඔවුන් වහන්සේගෙ "ම ජීවිතයට වඩා ඔවුන් වහන්සේ ආදරය කළ අපව අනාථ වීමට ඉඩ නොදී අප සමග ලෝකාවසානය දක්වා විසීමටයි. **ශු.ගර්ට්රූට්** මුනිවරියට ඔවුන් වහන්සේ වදාළ වචන මෙසේ ය: **"මාගේ සංතෝෂය මනුෂ්‍ය දරුවන් සඳහා සිටීම ය. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ස්ථාපිත කළේ මේ පරමාර්ථය සඳහා ය. "** (ඥානාර්ථ ප්‍රදීපය)

දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ යනු දෙවියන් වහන්සේගේ ප්‍රේමයේ ජීවනය අපේ ඇස්වලින් දකින, ස්පර්ශ කරන, අපේ හදවතට දැනෙන සක්‍රමේන්තුමය ප්‍රකාශනයයි. දෙවියන් වහන්සේ ස්වකීය සභාව නමැති දරුවා සමග සදහටම වාසය කිරීම ඒ තුළින් ස්ථිර කෙරේ. දිවා රැයේ තම දරුවන් දෙස දෑස් දල්වා බලා සිටින මෑණියන් ද, ඔවුන් රැකවල් කරන පියාණන් ද වන සේක්, දිව්‍ය සත්ප්‍රසාද වහන්සේම ය.

(ආ) ශු.ජොහාන් 6:48-56 දක්වා කියවමු.
මෙම සුවිශේෂ පාඨයේ යෙදෙන ග්‍රීක යෙදුම් වෙත අවධානය යොමු කිරීමේදී මාංශය අනුභවය යන්නට යෙදී ඇත්තේ 'ෆාගෙයින්' (Phagein) යන ක්‍රියා පදයයි. එහි අර්ථය 'අනුභව කිරීම' හෝ 'වැළඳීමයි'. නමුත් ජුවාම් සුවිශේෂයේ 6:54 වගන්තියේ සිට ක්‍රිස්තුන් වහන්සේ ඒ වෙනුවට යොදා ගන්නා වචනය 'ට්‍රොගෙයින් ' (trogein) යන්නයි. එහි අර්ථය 'හපනවා', 'චිකා කනවා' යන්නයි.
ට්‍රොගෙයින් යන වචනය තුළ සැඟවී තිබෙන්නේ කිරි දරුවෙකු තම මවගෙන් ලබන පෝෂණය තලු මරමින් රස විඳින ආකාරයයි.

ගර්භාෂයේදී මවගේ ඇට මිදුළු වල ඇති මැරබොන් උරන දරුවා මව් කුසින් පිටතට පැමිණි විට ඇයගේ කිරි උරා බොයි. ශු.ජොහාන් තුමාට අනුව 'මේ මාගේ ශරීරය ය, එය අනුභව කරන්න ; මේ මාගේ රුධිරය ය, එය රැගෙන පානය කරන්න' යැයි කීමෙන් ක්‍රිස්තුන් වහන්සේ ද, සිය රුධිරය දිය කර දරුවාට කිරි පොවන මවක් ලෙසින් අපට පෙන්වා දෙයි. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ "මාතෘ ක්‍රිස්තුන් වහන්සේ " ලෙස දකින්නට මුල් අවධියේ සිටම අපෝස්තුළුවරුන්ට හැකි වුණු බව මින් පැහැදිලි වේ.

(ඇ) පුරාණයේ සිටම තම ජනතාව පෝෂණය කිරීම සඳහා දෙවියන් වහන්සේ තුළ පැවති ආශාව නික්මයාමේදී 'මන්නා' සැපයීම තුළින් ද (නික්මයාම 16:31-36) නව ගිවිසුම තුළ පන් දහසකට කෑම දීම පිළිබඳ ප්‍රාතිහාර්යෙන් ද සනාථ වේ. (ශු.ජොහාන් 6:4-13) ආහාර පාන මිනිසා නිසා වෙන්වූ දෙයකි. මිනිසා අනුභව කළ පසු ඒවායේ ස්වභාවය ද වෙනස් වී ඒවා මිනිසාගේම කොටසක් බවට පත් වේ.

එලෙසම ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිතය ද අප උදෙසාම පුදනු ලැබීය. ජීවන දායක ආහාරය වෙමින් අප තුළ නැති වෙමින් අපව ඇති කරයි. මෙලෙස ආරම්භයේ සිටම දෙවියන් වහන්සේ තම ප්‍රේමවන්ත ජනතාව පෝෂණය කිරීමට ඇති මාතෘක සෙනෙහසින් පෙළුණු සේක. අවසානයේ තම පුතණුවන් අපගේ ආහාරය වන්නට සලසමින් ඔවුන් වහන්සේ අපට ප්‍රේම කළ සේක.

(ඈ) මවක් සහ පියෙක් තම දරුවන්ට ආදරය දක්වනුයේ ඔවුන්ගේ ජීවිතය ද දෙවෙනි තැනට දමමිනි. දරුවා උදෙසා කැඩෙන්නට, බිඳෙන්නට, වැයවෙන්නට ඔවුන් කිසිවිටක පසුබට නොවේ. එලෙසින් විශ්වය මැවූ සර්වබලධාරි දෙවියන් වහන්සේ තම මැවිල්ල වූ මිනිස් දරුවා උදෙසා කොතරම් කුඩා වූවාද යන්න දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ තුළින් ප්‍රත්‍යක්ෂ වේ. ඔවුන් වහන්සේ අපේ මුව තුළ කැඩෙයි, බිඳෙයි, පොඩි වෙයි (ශු.ලූක් 22:19) අපව ඇති වෙනු සඳහා ඔවුන් වහන්සේ අප තුළ නැති වෙයි.

එලෙසින් දිව්‍ය සත්ප්‍රසාදීය සමිඳුන් පූර්ණ ප්‍රේමය යි. ප්‍රේමයේ වැඩ සිටීමයි. මුළු සත්ප්‍රසාද පූපය තුළම ඔවුන් වහන්සේ වැඩ සිටිති. ඒ කුඩා වීම කොතරම් ද, සත්ප්‍රසාද පූපයේ ඉතා කුඩා කුඩක පවා ඔවුන් වහන්සේ වැඩ සිටිති. එතරම් බිඳීමක්, කැඩීමක්, කුඩාවීමක් කළ හැක්කේ මවකට පමණකි. පියෙකුට පමණකි.

## 04. අප දෙසට :

* (1 ජොහාන් 1:1-2) ශු.ජොහාන් තුමා ඇස්වලින් දැක, දැක බලා අත්වලින් ස්පර්ශ කළ ජීවනය අද අපි අත්දකින්නේ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ තුළිණි. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ තුළින් ඒ ජීවනය ස්පර්ශ කළ ජීවිත අත්දැකීමක් බෙදා ගනිමු.

* පෙලිකන් නමැති කුරුල්ලා තම පැටවුන්ගේ කුසගින්න නිවන්නට තම හදවත කඩා දෙමින් සිය ජීවිතය පූජා කරයි. මවක් තම දරුවාගේ කුසගිනි නිවන්නට තම ලෙය කිරි කරයි. මවකගේ ආදරය එතරම් අසීමිතයි. එවැනි වූ ප්‍රේමයකින් තම ශරීරයත්, රුධිරයත් දානය කරමින් අප ආත්මික ආහාරය වන්නාවූ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ මාතෘ ක්‍රිස්තුන් වහන්සේයි. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ තුළින් ගලා එන ක්‍රිස්තුන් වහන්සේගේ මාතෘක ආදරයට ඔබ අවදි වී තිබේ ද?
(සාකච්ඡා කරන්න)

* තම දරුවා වෙනුවෙන් කැඩෙන්නට, බිඳෙන්නට, වැයවෙන්නට මවෙක් - පියෙක් කිසිවිට පසුබට නොවේ. ඒ ප්‍රේමය ද අභිබවමින් සර්වබලධාරි දෙවිඳුන් මිනිසා උදෙසා කුඩා පූපයක් වෙමින් ඔවුන් තුළ කැඩෙයි, බිඳෙයි, නැතිවෙයි. එම භෝජනයට කැඳවනු ලැබූ භාග්‍යවන්ත ජනතාව වෙත ඔවුන් වහන්සේ කරන ආරාධනය ද ඒ පිතෘක මාතෘක ආදරයෙන් පොහොසත් වී සහෝදරයා උදෙසා කැඩෙන්නටයි, බිඳෙන්නටයි, නැති වෙන්නටයි. මේ කැඳවීමට ඔබ මා අවදි වී සිටී ද?
(සාකච්ඡා කරන්න)

## 05. හෙට දවස පුරා :

* දිව්‍ය පූජා යාගයට සම්බන්ධ වී දිව්‍ය සත්ප්‍රසාදීය සමිඳුන් වෙතින් ගලා එන දෙවියන් වහන්සේගේ පිතෘක මාතෘක ආදරය රස විඳිමු.
* ප්‍රේමය නිසාම මා තුළට වඩින ජේසු සමිඳුන් දුබල මගේ ප්‍රේමය පතන ප්‍රේමයේ යාචකයාණෝයි.
  දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ඔවුන් වහන්සේ සමඟ තනි වන කෙටි කාලය තුළ 'ජේසුනි, මම
  ඔබ වහන්සේට ආදරෙයි' යනුවෙන් ඔවුන් වහන්සේ අමතමු.
* හැකි සැම විටම දිව්‍ය සත්ප්‍රසාදීය සමිඳුන් බැහැදකිමින් ඔවුන් වහන්සේ සමඟ තනි වෙමු.

## 06. අවසන් ප්‍රශංසාව:

පුබුදු ගී අංක 234 "අත්ලට වත්කළ රස මී පැණි සේ....."

*********************

# නවවන පෙරමඟ සූදානම
# මගේ පුත්‍රභාවය

## 01. ප්‍රශංසාවට යොමුව:

"ඔබ දෙස මා නෙත..." (පුබුදු ගි අංක 366) ගයමින් ක්‍රිස්තුන් වහන්සේගේ අභ්‍යයන්තරය දෙස බැලීමට යොමු කරන්න.

ගීය පැහැදිලි කරන්න.

"ඔබ අත්දකින්නාවු මහෝත්තමයාණන්ගේ පිතෘක මාතෘක ආදරය ද" යන වචනයට මුලික අවධානය දෙමින් ක්‍රිස්තුන් වහන්සේ දෙවියන් වහන්සේගේ පූර්ණ ප්‍රේමය තුළ (පිතෘක මාතෘක ආදරය) දේව පුත්‍රභාවය අත්දකින සේ මාවද මේ මොහොතේ පූර්ණ ප්‍රේමයෙන් පුරවන බව අයිති කර ගනිමින් ප්‍රශංසාවට පිවිසෙමු.

අබ්බා අබ්බා පියාණනේ
අබ්බා අපේ පියාණනේ
අබ්බා අබ්බා පියාණනේ
අබ්බා මගේ පියාණනේ

අබ්බා අබ්බා මෑණියනේ
අබ්බා අපේ මෑණියනේ
අබ්බා අබ්බා මෑණියනේ
අබ්බා මගේ මෑණියනේ
යයි ගයමින් ප්‍රශංසාව අවසන් කරමු.

## 02. ආපසු බැලීම.

* දිව්‍ය සත්ප්‍රසාදීය සමිඳුන් බැහැදකිමින් ඔවුන් වහන්සේ සමඟ තනිවෙන්නට ඔබට හැකි වුනාද?
* දිව්‍ය පූජාවට සම්බන්ධ වී දිව්‍ය සත්ප්‍රසාදීය සමිඳුන් ඔබ තුළට ලබා ගනිමින් අළුත් අන්දමට දෙවියන් වහන්සේගේ මාතෘක පිතෘක ආදරය ඒ තුළ අත්දකින්නට ඔබට හැකි වුනාද?
* දිව්‍ය සත්ප්‍රසාදීය සමිඳුන්ගේ ප්‍රේමය තුළ රැඳෙන්නට ඔබ ගත් තීරණ මොනවාද?

## 03. දවසේ සුපුවත

**පූර්ණ ප්‍රේමයට පිපාසය**

* රාජ්‍යය සඳහා පුතෙකුට පුතෙක් අතදීම්වල එක් අතදීමක මහෝත්තමයාණන්ට අම්මා යැයි අමතන්නට ලැබීම පූර්ණවූ ප්‍රේමයට පිපාසයක් යැයි ස්වාමි තාත්තා සඳහන් කර ඇත.

**(අ) ක්‍රිස්තුන් වහන්සේ දෙස බලමු**

* ශු.මතෙව් 5:44-45, 48
  ශු.ජුවාම් 13:1

* මිනිසාගේ පූර්ණත්වයේ මිනුම් දණ්ඩ ලෙස දෙව් පියාණන් වහන්සේව (ශු.මතෙව් 5:48) ක්‍රිස්තුන් වහන්සේ ඉදිරිපත් කරන සේක.
* ක්‍රිස්තුන් වහන්සේ මෙලොව හිතවතුන්ට අන්තිමය දක්වා ප්‍රේම කිරීමෙන් පියාණන් වහන්සේගේ ස්වභාවය අපට පෙන්වා දෙයි
* මේ ප්‍රේමය (ක්‍රිස්තුන් වහන්සේ) ඔවුන් වහන්සේය. ඔවුන් වහන්සේ එය තම ජීවිතයෙන් පූර්ණව එළිදරව් කළ සේක.
* එම නිසා ඔවුන් වහන්සේ සම්පූර්ණයෙන් පුත්‍රයාණන් වහන්සේ වන සේක.
* එසේම ඔවුන් වහන්සේගේ මිනුම් දඬු අනුව දේව පුත්‍රයන් බවට පත්වීමට අපට ඇරයුම් කරන සේක. (ශු.මතෙව් 5:43-45)
* සතුරන්ට ප්‍රේම කිරීම මඟින් දෙවියන් වහන්සේගේ ස්වභාවය හඳුනා ගැනීමට සහ අපටද 'පුත්‍රයන් ' වන පිණිස. එම ප්‍රේමය තුළ "පූර්ණත්වය" ලබා ගැනීමට සමිඳාණන් වහන්සේ අපට උගන්වන විට දෙවියන් වහන්සේ හා ක්‍රිස්තුන් වහන්සේ අතර පවතින සම්බන්ධතාවය සම්පූර්ණයෙන් ප්‍රත්‍යක්ෂ වෙයි.
* දෙවියන් වහන්සේ කවුරුන්ද යන්න හා ඔවුන් වහන්සේ කොයි වගේද යන්න අප දැනගන්නේ ඔවුන් වහන්සේගේ කැඩපත වූ ක්‍රිස්තුන් වහන්සේ තුළිණි.
* තම සකල මැවිල්ලට දෙවියන් වහන්සේ සම්බන්ධකම් පවත්වන්නේ දරුවෙකුට දෙගුරුන් මෙන්ය. සම්පිණ්ඩව ගත් කල ඔවුන් වහන්සේ සියල්ලන්ටම අබ්බා / අම්මා වන සේක.

* අබ්බා අම්මා වන මහෝත්තමයාණන් වහන්සේ තම දරුවන් තමන්ට හා කිසිවකට බිල්ලක් හෝ ගොදුරක් වනු දැක්මට අකමැති වන සේක. (වහලෙක් කර ගැනීම - උපකරණයක් කර ගැනීම)

**(ආ) ක්‍රිස්තුන් වහන්සේට ඒකාබද්ධ වන්න**

* ක්‍රිස්තුන් වහන්සේ මාංශගත වූ සැබෑ මනුෂ්‍යයා ලෙස සහ පූර්ණව දෙවියන් වහන්සේට අයිති වීම තුළ දේව පුත්‍රභාවය තුළට එනම් ඔවුන් වහන්සේ අනාවරණය කරන දෙවියන් වහන්සේට පූර්ණ වශයෙන් අයිතිවීම තුළට අප සැමවද ඇද ගැනීමට ඔවුන් වහන්සේට අවශ්‍යයය.
* ක්‍රිස්තුන් වහන්සේ සමඟ ගැඹුරු ඒකාග්‍රතාවයකට වර්ධනය වීම මඟින් අපට දේව පුත්‍රයන් වීමේ උරුමය ලැබෙයි.
* අපගේ පුත්‍රභාවය ක්‍රිස්තුන් වහන්සේ අනුව යෑම සමඟ අනන්‍ය වීම බවට පත් වෙයි.
* ඒ අනුව දෙවියන් වහන්සේට අබ්බා තාත්තේ අබ්බා අම්මේ යනුවෙන් ආමන්ත්‍රණය කිරීම. අප වෙත කෙරෙන කැඳවීමක් බවට පත් වෙයි.
* එය "දරුවෙකු" ලෙස එනම් පුතෙකු හෝ දුවක ලෙස හෝ ජීවත් වීමට වෙයි.
* මෙහි අර්ථය පූර්ණ ප්‍රේමයට විවෘත වීමයි. එනම්, දේව දරුවෙකු ලෙස දෙවියන් වහන්සේගෙන් යැපීම පමණක් නොවේ. මිනිසාගේ පැවැත්ම පූර්ණ කරන සහ එයට අර්ථයක් සහ අභිමානයක් ලබා දෙන ප්‍රේම සම්බන්ධතාවයෙහි හැසිරීමකි, පැවතීමකි, ජීවත් වීමකි.

## 04. අප දෙසට:

(අ) * දරුවෙකු බිහිවනුයේ පියෙකු හා මවක එක්වීමෙනි. දරුවා වැඩි වර්ධනය වනුයේ පියාගේ හා මවගේ ද ආදරය ලැබෙන ප්‍රමාණයට ය. එහි අඩු වැඩි වීම පුද්ගලයාගේ බාහිර මෙන්ම ඇතුලාන්ත වර්ධනයේ අඩු වැඩිවීම කෙරෙහි අප්‍රමාණව බලපායි.

* මිනිසා දේව ස්වරූපයට මවා ඇති නිසා අපි ඔවුන් වහන්සේට අයිති වෙමු. එම නිසා සීමිත මිනිස් ප්‍රේමයෙන් පමණක්

සැනසීමක්, සෑහීමක් අත්දැක මිනිසාට පූර්ණ විය නොහැකිය. මිනිසා ලෞකික දෙයකින් හෝ මිනිස් ආදරයෙන් සංතෘප්ත නොවන්නේ මිනිසාගේ මේ අභ්‍යන්තරික දේව ස්වරූපය හෙවත් ආත්මය හෙවත් ගැඹුර නිසාය.

* **"දෙවියනි මිනිසාට ඔබෙන් තොරව සැනසීමක් නැත"** යනුවෙන් ශුද්ධවර අගුස්තීනු මුනිතුමා පැවසුවේද එම නිසාය.
* පියාගේ මවගේ ආදරයේ උල්පත දෙවියන් වහන්සේය. ඒ ස්වරූපයට ජනිත වී වැඩී බිහි වී වර්ධනය වන මිනිසාට පූර්ණත්වය හෙවත් දේව පුත්‍රභාවයට අයිතිවීම සඳහා අබ්බා පියාණන්ගේ හා මෑණියන්ගේ පූර්ණ ප්‍රේමය අත්දැකීමට විවෘත වීම ඉඩ දීම අවශ්‍යය ය.

(ආ) * ජීවිතයේ අප අත්දකින බොහෝ තත්ත්වයන්ට හේතුව අපට ලැබී තිබෙන, ලැබෙන ආදරයේ ප්‍රමාණයයි. විශේෂයෙන් ආදරයේ හිඟයන් අපගේ ජීවිතයට තදින්ම බලපා ඇත. මනුෂ්‍ය ආදරය අඩුවෙන් අත්දැක ඇති අයෙකුට දේව ආදරය අත්දැකීම අපහසු විය හැක. එහි අදහස සීමිත වූ මනුෂ්‍යයාට අසීමිතව ආදරය කිරීමට නොහැකි බවයි. එහෙත් දේව ප්‍රේමය මනුෂ්‍ය ප්‍රේමය අභිබවා ගොස් අසීමිත පිතෘක මාතෘක ප්‍රේමයෙන් අපව පුරවාලයි.

* "මා අත්දකින්නාවූ ප්‍රේමයේ හිඟයන් පුරවාලන්නට හැක්කේ ඔවුන් වහන්සේට පමණි. එම නිසා ක්‍රිස්තුස් වහන්සේව පිතෘක මාතෘක ප්‍රේමයෙන් පුරවාලු පියාණන් වහන්සේ මගේද අබ්බා අම්මා - අබ්බා තාත්තා ලෙස අත්දැකීමට කැඳවනු ලබයි.

## 05. සාකච්ඡාවට -

(අ) පවුල තුළ, සංඝය තුළ, සමාජය තුළ, පෞද්ගලිකව අප කැඳවා ඇත්තේ අප ළඟ තිබෙන
මිනිස් ප්‍රේමයෙන් පමණක් ප්‍රේම කිරීමට නොව ක්‍රිස්තියානි ප්‍රේමය (දේව මාතෘක - පිතෘක ප්‍රේමය) ලබා ගෙන එම ප්‍රේමයෙන් ප්‍රේම කිරීමටයි. අබ්බා අම්මා - අබ්බා තාත්තාගේ පිතෘක මාතෘක ආදරය (පූර්ණ ප්‍රේමය) කෙතරම් අත්දකිනවාද? දේව ප්‍රේමයෙන් ප්‍රේම කරනවාද?

(ආ) දෙවියන් වහන්සේගේ පිතෘක මාතෘක ප්‍රේමය අත්දකින්නට පුබුදුව තුළින් අපට ලැබී ඇති වරප්‍රසාදයන්ට ඔබ ඇතුළු වෙනවාද?
- මගේ පැය - දේව වචනය දිනපතා ආහාරය කර ගැනීම, ක්‍රිස්තුස් වහන්සේ දෙස බැලීම
- නිරන්තර අවදිවීම - සාංඝික වීම
- ප්‍රශංසාව

## 06. ප්‍රශංසාවට යොමුව:

ගී අංක 374 "පිපාසයි පිපාසයි මට පිපාසයි ..." වචනවලට අවධානය දෙමින් ගායනා කරමු.

අවදි වෙමු, පිපාසයක් ඇති කරගනිමු :

* පියාණන්ගේ පිතෘක මාතෘක ප්‍රේමයට
* ප්‍රේමයාණන් වූ ශුද්ධාත්මයාණන්ගේ මෙහෙයවීමට
* පුතණුවන් මෙන් ඉඩදීමට, භාරවීමට, නැතිවීමට, ඇතිවීමට, අපට ලැබෙන කැඳවීමට.

  අවදිවීමේ තෑග්ග දෙන්න මට අබ්බා අම්මා මෑණියනේ යනුවෙන් යාච්ඤා කරමු.

**ප්‍රශංසාව:**

පිතෘක මාතෘක ප්‍රේමයෙන් අපව ඈත් කරන අන්ධකාරයන් හඳුනා ගෙන ඒවා ගැන කලකිරීමට පත් නොවී ශුද්ධාත්ම මෙහෙයවීමට නතු වෙමින් පූර්ණ ප්‍රේමය වූ දේව ප්‍රේමය කෙරෙහි විශ්වාස කරමු. ඉල්ලන්නන්ට පියාණන් වහන්සේ ක්‍රිස්තුන් වහන්සේ කරණ කොට ගෙන ලබාදෙන තිළිණය ශුද්ධාත්මයාණන් වහන්සේ බව ශුද්ධවූ ලූක් 11:13 සඳහන් කරයි. දෙවියන් වහන්සේගේ තිළිණය තමන් වහන්සේමය. ඔවුන් වහන්සේ අපට දෙන යහපත් දේ තමන් වහන්සේමය. ක්‍රිස්තුන් වහන්සේ දිවි පිදීමෙන් පෙන්තකෝස්ත දිනදී අපට දෙනු ලැබුවේ ඔවුන් වහන්සේවම ය. ඔවුන් වහන්සේගේම ජීවිතයයි. පූර්ණ ප්‍රේමයයි. අප ප්‍රසාද ස්නාපනයෙන් ලබා පිබිදීමෙන් පුබුදු කරනු ලැබූ ආලේපය මෙවරද පෙන්තකෝස්ත මංගල්‍ය දිනදී බලගන්වන ලෙස ප්‍රශංසා කරමින් යාච්ඤා කරමු. ප්‍රේමයාණන් වූ ශුද්ධාත්මයාණන් අප තුළ

වැඩ සිටින බව විශ්වාස කරමින් ශුද්ධාත්ම වරම් දීමනා අත්දකින ප්‍රශංසාවකට ඇතුළු වෙමු.

**07. හෙට දවස පුරා:**

* හෙට දවස පුබුදු ජනතාව වන අප ශුද්ධාත්ම ආගමන මංගලෝත්සවය සමරන දවසයි.
* ශුද්ධාත්ම ආගමනයත්, පියාණන්ගේ පිතෘක මාතෘක ප්‍රේමයත් අත්දකින රාත්‍රියක් වන බව විශ්වාස කරමු.
* එය තවත් එක් රැළියක් කර නොගෙන අප ජීවිත තුළ පෙරළියක් ඇතිවන දිනයක් බව විශ්වාස කරමු.
* ගැඹුරු විවෘත භාවයකින් යුතුව අන් අයටද සාංඝික වෙමින් වචනයට සවන් දීමේ පිපාසයකින් යුතුව ශුද්ධාත්ම රැළියට සහභාගි වෙමු.
* දෙවිඳාණෝ පීතෘත්වයේ පමණක් නොව මාතෘත්වයේද උල්පත වන්නාහ. එම නිසා ඔවුන් වහන්සේගේ ප්‍රේමය තුළ පියෙකුගේ ප්‍රේමයේ ලක්ෂණ පමණක් නොව මවකගේ ප්‍රේමයේ ලක්ෂණ ද රැඳී ඇත. එම නිසා පීතෘත්වයේ හා මාතෘත්වයේ උල්පත වන සර්වබලධාරි මැවුම්කරුවාණන් වහන්සේට අපි මෙවර රැළියේදී මුව පුරා හද පුරා "අබ්බා තාත්තේ ! අබ්බා අම්මේ ! " යනුවෙන් අමතමු.

*********************

පුබුදු මුද්‍රණාලය, නො.452, ජාතික මැසිලිකා මාවත, රාගම.
දුරකථන 011 5288344-5, ෆැක්ස් 011 2958439
E-mail : press@pubuduwa.org